

කාර්යසාධන වාර්තාව

2017

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

නො. 42,

ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,

තැ.පෙ. 537,

කොළඹ - 07.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

ඉදිරි දැක්ම

"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා
සියලු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර
සංවර්ධනය"

මෙහෙවර

"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය
හා
සියලු කෘෂිකාර්මික ඉඩම්වලින්
ප්‍රශස්ත ඵලදායිතාවයක් ලබා ගත හැකි වන පරිදි
ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ
සේවාවන් සැකසීම හා කාලානුරූපව
පවත්වා ගෙන යාම"

හැඳින්වීම

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.

ශ්‍රී ලාංකීය ගොවි ජනතාවට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුණින් 1957 ඔක්තෝබර් 01 වන දින ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද්දේ එතෙක් පැවති ආහාර දෙපාර්තමේන්තුව අහෝසි කරමිනි. 1958 අංක 01 දරණ කුඹුරු ඉඩම් පනතින් බල ගන්වන ලද මෙම දෙපාර්තමේන්තුව මේ වනවිට 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා එහි සංශෝධනයන් අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නමින් ක්‍රියාත්මක වේ.

අරමුණු හා ප්‍රධාන කාර්යයන්

01. රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීමට අදාළ විධි විධාන සැලැස්වීම.

02. කෘෂිකාර්මික ඉඩම් හිමියන්, කෘෂිකාර්මික ඉඩම් හිමි ගොවීන් සහ භුක්තිකරුවන්/අද ගොවීන්ගේ වගා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.

03. ගොවි සංවිධාන ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ නියෝග සෑදීම සහ එම විධි විධාන ක්‍රියාත්මක වීම තහවුරු කිරීම.

04. ගොවිජන සංවර්ධන සභා ස්ථාපිත කිරීම සහ ඒවායේ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම සහ අධීක්ෂණය.

05. දිවයින පුරා පවත්නා සෑම ගොවිජන සංවර්ධන සභා බල ප්‍රදේශයකටම අදාළව කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ තොරතුරු ඇතුළත් කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන පිළියෙල කර සංශෝධනය හා ප්‍රතිශෝධනය කර පවත්වාගෙන යාම.

06. කෘෂිකාර්මික ඉඩම් වලට අදාළ අඳ ගොවි ගැටළු සහ වෙනත් ගොවි ආරවුල් විසඳීම සඳහා කටයුතු කිරීම.

07. සුළු වාරි කර්මාන්ත සහ ජල ප්‍රභවයන්ගේ ඵලදායීතාවය, ආරක්ෂාව, සංරක්ෂණය සහ කළමනාකරණයට අදාළ වන විධි විධාන ක්‍රියාත්මක කිරීම.

08. ගොවිජන සංවර්ධන පනත හා රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති උල්ලංඝනය කරමින් ක්‍රියාත්මක වන පාර්ශවයන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම.

09. රජයේ කෘෂිකාර්මික හා කාලීන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීමේදී වෙනත් ආයතන වෙත අවශ්‍ය වන්නා වූ ආයතනික, නෛතික, සහායක හා කළමනාකරණ සේවාවන් සැලසීම.

ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගෙන්.....

කලාපීය අන් රටවලට සාපේක්ෂව කුඩා භූමි ප්‍රමාණයක් හා කුඩා ශ්‍රම බලකායක් සහිතව පැවතියත්, පරසතුරු ආක්‍රමණයන්ට නොබියව මුහුණ දෙමින් ශක්තිමත්ව ස්වයංපෝෂිත ආර්ථිකයකට හිමිකම් කියූ ශ්‍රී ලංකාව සියවස් ගණනක් පුරා ස්වෛරීයව නැගී සිටීමට බලපෑ ප්‍රධාන කරුණක් වූයේ ලක්දිව ජීවත් වූ ජනතාව වෙත කායික හා මානසික යහ පැවැත්මක් පැවතීමය. වස විසෙන් තොර එවැනි තත්ත්වයක් කරා ලාංකීය ජන සමාජය යොමු කිරීමට අනුපමේය මෙහෙයක් ඉටු කරන ලද්දේ හෙළ ගොවි පරපුරය. එවන් පරපුරක් වෙත වර්තමානයේ සේවය කිරීමට ලැබීම මා ලද භාග්‍යක් කොට සළකමි.

පුරාතනයේ සිට රාජ්‍ය අනුග්‍රහය සහිතව නිසි ජල කළමනාකරණයකින් යුතුව, පාරම්පරික අනන්‍ය තාක්ෂණයකින් බල ගැන්වුණු දේශීය කෘෂි ආර්ථිකය වෙත වර්තමානයේ එල්ල වනු ලබන ගැටළුකාරී තත්ත්වයන් මඟ හරවමින් , ගොවි ජනතාවගේ අභිවෘද්ධිය හා සමස්ත ගොවිබිම් වල ඵලදායී හා තිරසාර සංවර්ධනය අපේක්ෂා කරමින් තම ක්‍රියාන්විතයන් දියත් කරනු ලබන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි 2017 වර්ෂයෙහි කාර්යසාධනය මෙමඟින් ඉදිරිපත් වේ.

සමස්ත ගොවි ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම හා ස්වයංපෝෂිත දේශීය කෘෂි ආර්ථිකයක් බිහිකිරීම අරමුණු කර ගනිමින්, තිරසාර සංවර්ධන අරමුණුවලට අනුගත වෙමින්, රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්තිමය තීරණ, ව්‍යාපෘති හා අනිකුත් ක්‍රියාවලීන්, නිසි පරිදි ක්‍රියාවට නැංවීම සඳහා සහ දෙපාර්තමේන්තුව වෙත පැවරුණු ඉලක්කයන් නිසි පරිදි සාක්ෂාත් කර ගැනීම උදෙසා වූ උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දුන් ගරු කෘෂිකර්ම අමාත්‍යතුමන් , ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමන් , ගරු කෘෂිකර්ම නියෝජ්‍ය අමාත්‍යතුමන්, අමාත්‍යාංශ ලේකම්තුමන් ප්‍රමුඛ කෘෂිකර්ම අමාත්‍යාංශයත්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු මෙහෙවර, යථාර්ථයක් කිරීම පිණිස අනුපමේය මෙහෙයක් ඉටු කල ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සමස්ත කාර්ය මණ්ඩලයත්, නිබඳව අප හා අත්වැල් බැඳගත් සමස්ත ශ්‍රී ලාංකික ගොවි ජනතාවත් හද පිරි ගෞරවයෙන් යුතුව සිහිපත් කරමි.

එමෙන්ම, 2017 කාර්යසාධන වාර්තාව එළි දැක්වීමට නන් අයුරින් උපදෙස් හා සහය ලබා දුන් සියලු දෙනා හට මාගේ ස්තූතිය පුද කර සිටිමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර.
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්.

පටුන

පිටුව

- ❖ පරිපාලන හා මානව සම්පත් සංවර්ධන අංශය. **01**
- ❖ සංවර්ධන හා ප්‍රගති පාලන අංශය. **21**
- ❖ ඉංජිනේරු අංශය. **27**
- ❖ ආයතනික සංවර්ධන අංශය **28**
- ❖ ප්‍රවාහන අංශය. **36**
- ❖ නීති අංශය. **37**
- ❖ ගිණුම් අංශය. **41**
- ❖ අභ්‍යන්තර විගණන අංශය. **45**
- ❖ ඵලදා වර්ධන හා අලෙවි අංශය. **47**
- ❖ ගොවිජන බැංකු අංශය **48**
- ❖ ජල කළමනාකරණ අංශය. **51**
- ❖ මෙහෙයුම් හා ඇගයුම් අංශය **55**
- ❖ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ඉටුකළ කර්තව්‍යන් **56**

ඇමුණුම්

- ඇමුණුම **01** **61**
- ඇමුණුම **02** **65**
- ඇමුණුම **03** **66**
- ඇමුණුම **04** **67**
- ඇමුණුම **05** **68**
- ඇමුණුම **06** **71**
- ඇමුණුම **07** **74**
- ඇමුණුම **08** **80**
- ඇමුණුම **09** **82**
- ඇමුණුම **10** **85**
- ඇමුණුම **11** **86**

01.පරිපාලන හා මානව සම්පත් සංවර්ධනය

1.1 ආයතන අංශය.

1.1.1 දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා අනුමත දීප ව්‍යාප්ත, ඒකාබද්ධ හා දෙපාර්තමේන්තුගත තනතුරු ඇතුළුව අනුමත මුළු සේවක සංඛ්‍යාව 18376 කි. 2017 වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 14092 කි. පුරප්පාඩු වූ සංඛ්‍යාව 4284 කි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කළමනාකරණ හා මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තනතුර හා කොමසාරිස් තනතුරු 03 ක් ද දෙපාර්තමේන්තුව සඳහා නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් තනතුරු 39 කින් ද සමන්විත වේ.

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ තනතුරු 09 ක් ද ශ්‍රී ලංකා ගණකාධිකාරි I වන පන්තියේ තනතුරු 01 ක් හා ගණකාධිකාරි තනතුරු 13 ක් ද ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරු 01 ක් ද ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ තනතුරු 01 ක් ද , සහිතව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 68 කින් සමන්විත වේ.

තෘතීය මට්ටමේ තනතුරු 645 ක් අනුමත වී ඇති අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට පුරප්පාඩු සංඛ්‍යාව 179 ක් විය. ද්විතීය මට්ටමේ තනතුරු 16065 ක් අනුමත වී ඇති අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට පුරප්පාඩු සංඛ්‍යාව 3058 ක් විය. ප්‍රාථමික මට්ටමේ තනතුරු 1543 ක් අනුමත වී ඇති අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට පුරප්පාඩු සංඛ්‍යාව 960 ක් විය.

1.1.2. කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය.

අනුමත සේවක කාර්ය මණ්ඩලය තුළ පුරප්පාඩු සම්පූර්ණ කර සේවා නියුක්තිය වැඩිකර ගැනීමටත්, ඒ තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, ඵලදායිතාවය හා කාර්යක්ෂමතාවය ඉහළ නංවමින් සම්පත් දායකත්වය වැඩි කර ගැනීමටත්, මෙම වර්ෂය තුළ කටයුතු කර ඇත. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානී ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම ප්‍රශස්ථ මට්ටමින් පවත්වා ගැනීමට වග කියන අතරම, වගකීම් ශක්තිමත් කිරීම සඳහා තමන් යටතේ සේවය කරන විවිධ මට්ටම් වල නිලධාරීන් හට වගකීම් පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථ වර්ධනය කර ගැනීම සඳහා කැප වූ සමාලෝචන වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වී සිටි දෙපාර්තමේන්තුවට අනුමත විවිධ තනතුරු වල සේවක සංඛ්‍යාව එක් එක් තනතුරු ආශ්‍රිතව පහත සඳහන් පරිදි වර්ගීකරණය කළ හැකිය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
සේවක සංඛ්‍යා තොරතුරු *2017.12.31* දිනට

අනු අංකය	තනතුර	සේවාව/ ශ්‍රේණිය	අනුමත සංඛ්‍යාව	සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
	ජ්‍යෙෂ්ඨ මට්ටම				
1	කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ.(විශේෂ)	1	0	1
2	අතිරේක කොමසාරිස් ජනරාල්	ශ්‍රී.ලං.ප.සේ.(විශේෂ)	1	1	0
3	කොමසාරිස්	ශ්‍රී.ලං.ප.සේ.	3	3	0
4	නියෝජ්‍ය කොමසාරිස්	ශ්‍රී ලං.ප.සේ.- II	43	3	16
5	සහකාර කොමසාරිස්	ශ්‍රී ලං.ප.සේ.- III		24	
6	අධ්‍යක්ෂ (ඉංජිනේරු)	ශ්‍රී.ලං.ඉ.සේ.	1	1	0
7	ඉංජිනේරු	ශ්‍රී.ලං.ඉ.සේ.	12	8	4
8	ඉංජිනේරු (යාන්ත්‍රික)	ශ්‍රී.ලං.ඉ.සේ.	1	0	1
9	ප්‍රධාන ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ.- I	1	1	0
10	ගණකාධිකාරී	ශ්‍රී.ලං.ග.සේ.	29	13	16
11	අභ්‍යන්තර විගණක	ශ්‍රී.ලං.ග.සේ.- I	1	1	0
12	සහකාර / නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)	ශ්‍රී.ලං.ක්‍රු.සම්.සේ.	1	1	0
13	නියෝජ්‍ය / සහකාර කොමසාරිස්	දෙපාර්තමේන්තු	28	12	16
14	නීති නිලධාරී	දෙපාර්තමේන්තු	1	0	1
			123	**68**	**55**
	තෘතීය මට්ටම				
15	ගොවිජන සංවර්ධන නිලධාරී (විශේෂ)	දෙපාර්තමේන්තු	30	0	30
16	පරිපාලන නිලධාරී	රා.ක.ස.සේ. - අධි	31	9	22
17	යාන්ත්‍රික අධිකාරී (විශේෂ)	දෙපාර්තමේන්තු	2	2	0
18	තාක්ෂණ නිලධාරී (විශේෂ)	ශ්‍රී.ලං.තා.සේ.	22	8	14
19	ගොවිජන සංවර්ධන නිලධාරී - I	දෙපාර්තමේන්තු	557	446	111
	ගොවිජන සංවර්ධන නිලධාරී - II	දෙපාර්තමේන්තු			
20	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී	ශ්‍රී.ලං.තො.තා.සේ.	1	0	1
21	භාෂා පරිවර්තක	භාෂා පරිවර්තක සේවය	2	1	1
			645	**466**	**179**
	ද්විතීය මට්ටම				
22	නීති සහකාර	සං.නි.සේ.- දෙපාර්තමේන්තු	247	13	54
23	ගොවිජන බැංකු ව්‍යාපෘති සහකාර	සං.නි.සේ.- දෙපාර්තමේන්තු		32	
24	සංවර්ධන සහකාර	සං.නි.සේ.- දෙපාර්තමේන්තු		116	
25	කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර	සං.නි.සේ.- දෙපාර්තමේන්තු		32	
26	ගොවිජන බැංකු නිලධාරී	දෙපාර්තමේන්තු	559	0	559
27	සහකාර ගොවිජන බැංකු නිලධාරී	දෙපාර්තමේන්තු	559	0	559
28	තාක්ෂණ සහායක	තාක්ෂණ සේවය	17	0	17

29	සංවර්ධන නිලධාරී	සං.නි.සේවය	2500	2022	478
30	කාර්මික නිලධාරී - I	ශ්‍රී ලං.තා.සේ. - I	105	61	44
	කාර්මික නිලධාරී - II	ශ්‍රී ලං.තා.සේ. - II			
	කාර්මික නිලධාරී - III	ශ්‍රී ලං.තා.සේ. - III			
31	සැළසුම් ශිල්පි	ශ්‍රී ලං.තා.සේ. -III, II, I	1	1	0
32	පුස්තකාලයාධිපති	පුස්තකාලයාධිපති සේවය	1	0	1
33	රාජ්‍ය කළමනාකරණ සහකාර - I	රා.ක.ස.සේ - I	538	376	162
	රාජ්‍ය කළමනාකරණ සහකාර - II	රා.ක.ස.සේ - II			
	රාජ්‍ය කළමනාකරණ සහකාර - III	රා.ක.ස.සේ - III			
34	ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු - I	දෙපාර්තමේන්තු	1118	860	258
	ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු - II	දෙපාර්තමේන්තු			
	ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු - III	දෙපාර්තමේන්තු			
35	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර I	දෙපාර්තමේන්තු - II	10400	9458	910
	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර II	දෙපාර්තමේන්තු - III			
36	ක්ෂේත්‍ර සහකාර	දෙපාර්තමේන්තු	2	0	2
37	ලඝු/යතුරු ලේඛක	දෙපාර්තමේන්තු	15	4	11
38	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	ශ්‍රී.ලං.තො.තා.සේ.	3	0	3
			16065	**12975**	**3057**
	<u>ප්‍රාථමික මට්ටම</u>				
39	රියදුරු - I	රියදුරු සේවය	111	92	19
	රියදුරු - II	රියදුරු සේවය			
	රියදුරු - III	රියදුරු සේවය			
40	යන්ත්‍ර කාර්මික	දෙපාර්තමේන්තු	8	0	8
41	යන්ත්‍ර ක්‍රියාකරු	දෙපාර්තමේන්තු	36	35	1
42	රිය සහායක	දෙපාර්තමේන්තු	21	6	15
43	මුරකරු	දෙපාර්තමේන්තු	83	56	27
44	කාර්යාල කාර්ය සහායක - I	කා.සේ.සේ.	110	96	14
	කාර්යාල කාර්ය සහායක - II	කා.සේ.සේ.			
	කාර්යාල කාර්ය සහායක - III	කා.සේ.සේ.			
45	සංචාරක බංගලා භාරකරු	දෙපාර්තමේන්තු	7	3	4
46	මධ්‍යස්ථාන කම්කරු	දෙපාර්තමේන්තු	559	274	285
47	මධ්‍යස්ථාන මුරකරු	දෙපාර්තමේන්තු	559	0	559
48	යන්ත්‍ර සහායක	දෙපාර්තමේන්තු	32	15	17
49	නුපුහුණු කම්කරු	දෙපාර්තමේන්තු	17	6	11
			1543	583	960
	එකතුව		**18376**	**14092**	**4284**

1.1.3. ආයතන කටයුතු.

(I) 2017 වර්ෂය තුළ දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ විචල්‍යතා පහත පරිදි වේ.

➢ 2017 වර්ෂය තුළදී මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

අනු අංකය	නිලධාරියාගේ නම	ස්ථාන මාරු වී ගිය දිනය	ස්ථාන මාරු වී ගිය සේවා ස්ථානය
01	එන්. ඩී.අයි. ඊ. ගුණරත්න මිය.	2017.01.09	ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
02	එම්. ඒ. එස්. වීරසිංහ මහතා.	2017.02.27	රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන අංශය
03	බී. ඒ. එන්. දිල්රුක්ෂි මිය.	2017.03.03	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - (දිස්ත්‍රික් පාලන අංශය)
04	කේ. ඒ.එස්. සමරජීව මිය.	2017.10.06	වයඹ පළාත් සභාව
05	වයි. අයි. ඩී. ගුණවර්ධන මිය.	2017.11.08	අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව

➢ දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

අනු අංකය	නිලධාරියාගේ නම	ස්ථාන මාරු වී පැමිණි දිනය	ස්ථාන මාරු වී පැමිණීමට පෙර සේවය කළ සේවා ස්ථානය
01	කේ. ඒ.ආර්. ධර්මසේන මිය.	2017.01.02	ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.
02	ඒ. එච්. එම්. එල්. අබේරත්න මහතා.	2017.08.17	කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය.
03	පී. ඩබ්. එස්. එච්. සරත්චන්ද්‍ර මිය.	2017.10.31	දෙහිඕවිට ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය.

(II) පත්වීම් ස්ථීර කිරීම.

උපාධිධාරී අභ්‍යාසලාභීන් ලෙස 2016 වර්ෂයේ බඳවා ගත් නිලධාරීන්ගෙන් 101 දෙනෙකු සංවර්ධන නිලධාරීන් ලෙස බඳවා ගන්නා ලද අතර තාක්ෂණ නිලධාරීන් ලෙස 11 දෙනෙක් හා රාජ්‍ය කළමනාකරණ සහකාර 22 දෙනෙක් , වශයෙන් බඳවා ගැනීම් සිදු කර ඇත.

(III) තනතුර අතහැරයාම්, ඉල්ලා අස්වීම්, මිය යාම් ,වැඩ තහනම් කිරීමට ලක්වීම්.

- සමාලෝචිත වර්ෂය තුළ සිදුවූ වෙනස්කම් පහත පරිදි වේ.

අනු අංකය	තනතුර	සේවය හැර යාම	ඉල්ලා අස්වීම	මිය යාම්	මුදා හැරීම	වැඩ තහනම්
01	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	01	-	01	03	-
02	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර	07	02	05	03	04
03	ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු	-	02	01	03	01
04	ගොවිජන සංවර්ධන නිලධාරී	-	-	01	01	02
05	තාක්ෂණ සේවය		01	-	01	-
06	කම්කරු			01	-	-

(IV) ස්ථාන මාරුවීම්.

- දීප ව්‍යාප්ත සේවාවන් හැරුණු විට ඒකාබද්ධ සේවා වල නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	තනතුර	ස්ථාන මාරු වී ගිය සංඛ්‍යාව	පැමිණි සංඛ්‍යාව
01	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	44	36
02	රියදුරු සේවය	01	-
03	සංවර්ධන නිලධාරී සේවය	25	13
04	කාර්යාල සේවක සේවය	02	01

(V) විශ්‍රාම ගැනීම්.

- සමාලෝචිත වර්ෂය තුළ විශ්‍රාම ගැනීම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	තනතුර	විශ්‍රාම ගිය සංඛ්‍යාව	
		වි.වැ.2.17 වගන්තියෙන්	**වි.වැ.2.12 වගන්තියෙන්**
01	ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය	01	-
02	සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තුමය)	01	-
03	රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	13	-
04	කාර්යාල සේවක සේවය	03	-
05	ගොවිජන සේවා මධ්‍යස්ථාන ලිපිකරු	11	01
06	කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර	15	-
07	කාර්මික නිලධාරී	12	-
08	ගොවිජන සංවර්ධන නිලධාරී	03	-
09	යන්ත්‍ර ක්‍රියාකරු	01	-
10	කම්කරු	01	-

1.1.4. විදේශ සංචාර හා පුහුණු.

- සමාලෝචිත වර්ෂය තුළදී විදේශ ශිෂ්‍යත්ව , සම්මේලන හා වැඩමුළුවලට සහභාගි වීම් පහත පරිදි වේ.

අංකය	පුහුණු සඳහා සහභාගී වූ මහත්ම මහත්මීන්	තනතුර	පුහුණු පාඨමාලාව	කාල සීමාව	රට	අනියම් දීමනාව	උණුසුම් ඇඳුම් දීමනාව
1	කේ. ඒ . සුමිත් වන්දන	සහකාර කොමසාරිස් (කෑගල්ල)	Community Driven Development	2017.01.08 - 2017.02.03	ඉන්දියාව	USD 1120 (Rs.151.73)	-
2	එස්. එම් . රණසිංහ බණ්ඩාර	ගො.සං.නි. (පරගම්මන)	Community Driven Development	2017.01.08 - 2017.02.03	ඉන්දියාව	USD 1120 (Rs.151.73)	-
3	එස්. එම් . සුජිත් ප්‍රේමරත්න	ගො.සං.නි. (බම්බිනිවත්ත)	Community Driven Development	2017.01.08 - 2017.02.03	ඉන්දියාව	USD 1120 (Rs.151.73)	-
4	එම්. ඒ . පි . මද්දේගොඩ	ගො.සං.නි. (දෙනිවල)	Community Driven Development	2017.01.08 - 2017.02.03	ඉන්දියාව	USD 1120 (Rs.151.73)	-
5	ජී.ඒ .ඩී . ස්වර්ණලතා	නියෝජ්‍ය කොමසාරිස් (කුරුණෑගල)	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	ශ්‍රී ලංකාව	-	-
6	බී.එම් . ජී. අලුත්ගම	ඉංජිනේරු	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	ශ්‍රී ලංකාව	-	-
7	ඒ .ඩී .එම් .ඩබ් .එච් . අබේරත්න	දිස්ත්‍රික් තාක්ෂණික නිලධාරී	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	ශ්‍රී ලංකාව	-	-
8	එම්.ජී . එම්. දයාවංශ	ඉංජිනේරු	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	ශ්‍රී ලංකාව	-	-

9	ඩබ් .කේ .එච් .එම් . විජේකෝන්	ඉංජිනේරු	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
10	ඒ .ඩි .ඒ. ඩබ් .එස්. ප්‍රදිප්	ගො. සං . නි.	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
11	එස් .කේ .එම් .ඒ .බි . බණ්ඩාර	ගො. සං. නි.	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
12	ඒ .එම් . ඩබ් .බි . අතපත්තු	ගො. සං. නි.	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
13	ඩබ්. බී. ජී. පියසේන	ගො. සං. නි.	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
14	ඊ.එම් . යු . ජයවර්ධන	ගො. සං. නි.	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
15	ඒ. එම්. ඒ. ඩි. හේරත්	ගො. සං. නි.	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
16	එම්. ජී. පි. ගම්ලත්	ගො. සං. නි.	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
17	ඩබ් .එල් . කරුණාතිලක	දිස්ත්‍රික් තාක්ෂණික නිලධාරී	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-
18	එන්.ඩබ් . පි. දසනායක	ඉංජිනේරු	Climate Sensitive Irrigation Management	2017.02.14 - 2017.02.16	නායිලන්තය	-	-

19	ආර්. නිශාන්තන්	කොමසාරිස් (යාපනය)	Agriculture Services	2017.03.30 - 2017.06.19	ලංකාව	USD 1200 (Rs.153.80)	-
20	ඒ. ආර් . ආර් . රාමනායක	සහකාර කොමසාරිස් (මොණරාගල)	2017 Seminar on Water Saving Irrigation Technologies of Arid & Semi Arid Areas Developing Countries	2017.03.31 - 2017.04.25	ලංකාව	USD 1000 (Rs.154.02)	pound 75 (Rs.192.04)
21	වී. ආයකුලන්	සහකාර කොමසාරිස් (කිලිනොච්චි)	2017 Seminar on Water Saving Irrigation Technologies of Arid & Semi Arid Areas Developing Countries	2017.03.31 - 2017.04.25	ලංකාව	USD 1000 (Rs.154.02)	pound 75 (Rs.192.04)
22	ඩබ්. ජී. සී. බී. කුමාරි	සහකාර කොමසාරිස් (රත්නපුර)	2017 Seminar on Water Saving Irrigation Technologies of Arid & Semi Arid Areas Developing Countries	2017.03.31 - 2017.04.25	ලංකාව	USD 1000 (Rs.154.02)	pound 75 (Rs.192.04)
23	එල් .කේ .පි .සි .ජී . සෝමදාස	සහකාර කොමසාරිස් (අම්පාර)	2017 Seminar on Water Saving Irrigation Technologies of Arid & Semi Arid Areas Developing Countries	2017.03.31 - 2017.04.25	ලංකාව	USD 1000 (Rs.154.02)	pound 75 (Rs.192.04)
24	කේ .ආර් .ඒ . ධර්මසේන	සහකාර කොමසාරිස් (මාතර)	2017 Seminar on Water Saving Irrigation Technologies of Arid & Semi Arid Areas Developing Countries	2017.03.31 - 2017.04.25	ලංකාව	USD 1000 (Rs.154.02)	pound 75 (Rs.192.04)
25	එස්. පි. සේනාධීර	සහකාර කොමසාරිස් (පුත්තලම)	Seminar on Biogas Industry Promotion and Management for Developing Countries	2017.04.07 - 2017.04.27	ලංකාව	USD 1000 (Rs.154.02)	pound 75 (Rs.192.04)
26	ඩබ්. එස් . ඩී. පෙරේරා	ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර (ප්‍රධාන කාර්යාලය)	Seminar on Soil & Conservation and Dryland Farming for Developing Countries	2017.04.19 - 2017.05.13	ලංකාව	USD 1000 (Rs.154.12)	pound 75 (Rs.194.55)
27	එම්. කේ. ජී. ප්‍රියශාන්ත	ප්‍රාදේශීය ඉංජිනේරු (හම්බන්තොට)	Seminar on Soil & Conservation and Dryland Farming for Developing Countries	2017.04.19 - 2017.05.13	ලංකාව	USD 1000 (Rs.154.12)	pound 75 (Rs.194.55)
28	ඒ.එස් . ඩබ් . දහනායක	සහකාර කොමසාරිස් (ගාල්ල)	Seminar on Soil & Conservation and Dryland Farming for Developing Countries	2017.04.19 - 2017.05.13	ලංකාව	USD 1000 (Rs.154.12)	pound 75 (Rs.194.55)
29	එච්. කේ .පි . රංජිත්	සහකාර කොමසාරිස් (පොළොන්නරුව)	Seminar on Soil & Conservation and Dryland Farming for Developing Countries	2017.04.19 - 2017.05.13	ලංකාව	USD 1000 (Rs.154.12)	pound 75 (Rs.194.55)

30	ඩී.පී . කේ . උඩවත්ත	ගො. සං. නි. (කොළඹ)	Seminar on Soil & Conservation and Dryland Farming for Developing Countries	2017.04.19 - 2017.05.13	ලංකාව	USD 1000 (Rs.154.12)	pound 75 (Rs.194.55)
31	එන්. ජී. ඒ. කේ. චන්ද්‍රවංශ	ගො. සං. නි. (මොණරාගල)	Seminar on Soil & Conservation and Dryland Farming for Developing Countries	2017.04.19 - 2017.05.13	ලංකාව	USD 1000 (Rs.154.12)	pound 75 (Rs.194.55)
32	ඩී.එම් . එස් .බී . දිසානායක	සහකාර කොමසාරිස් (බදුල්ල)	Training Course on Agricultural Products Circulation Technology Developing Countries	2017.04.28 - 2017.06.26	ලංකාව	USD 1200 (Rs.154.29)	pound 75 (Rs.198.13)
33	ඩබ්. ගුණසේන	සහකාර කොමසාරිස් (රත්නපුර)	Training Course on Agricultural Products Circulation Technology Developing Countries	2017.04.28 - 2017.06.26	ලංකාව	USD 1200 (Rs.154.29)	pound 75 (Rs.198.13)
34	ඒ. එන්. එස් දේවප්‍රිය	සහකාර කොමසාරිස් (මහනුවර)	Training Course on Agricultural Products Circulation Technology Developing Countries	2017.04.28 - 2017.06.26	ලංකාව	USD 1200 (Rs.154.29)	pound 75 (Rs.198.13)
35	ප්‍රභාත් විතාරණ	ඉංජිනේරු (ජල කළමනාකරණ)	Counterpart Training Programme Organized By JICA	2017.05.14 - 2017.05.27	ජපානය	USD 560 (Rs.154.34)	pound 75 (Rs.199.64)
36	එස්.ඒ.ඩී.වයි. සෝමවංශ	සහකාර කොමසාරිස් (අනුරාධපුර)	Counterpart Training Programme Organized By JICA	2017.05.14 - 2017.05.27	ජපානය	USD 560 (Rs.154.34)	pound 75 (Rs.199.64)
37	ආර්. විජය කුමාර්	සහකාර කොමසාරිස් (වව්නියා)	Counterpart Training Programme Organized By JICA	2017.05.14 - 2017.05.27	ජපානය	USD 560 (Rs.154.34)	pound 75 (Rs.199.64)
38	කේ. දිනේෂ් කුමාර්	ප්‍රාදේශීය ඉංජිනේරු (යාපනය)	Counterpart Training Programme Organized By JICA	2017.05.14 - 2017.05.27	ලංකාව	USD 560 (Rs.154.34)	pound 75 (Rs.199.64)
39	එච්. එම්. කුලරත්න	ගො.සං.නි. (හොරොව්පතාන)	Counterpart Training Programme Organized By JICA	2017.05.14 - 2017.05.27	ලංකාව	USD 560 (Rs.154.34)	pound 75 (Rs.199.64)
40	කේ. තිලිපන්	සංවර්ධන නිලධාරී (ඕමන්ත)	Counterpart Training Programme Organized By JICA	2017.05.14 - 2017.05.27	ලංකාව	USD 560 (Rs.154.34)	pound 75 (Rs.199.64)

41	පී. තනිගාසලම්	ඉංජිනේරු සහකාර(වව්නියා)	Counterpart Training Programme Organized By JICA	2017.05.14 - 2017.05.27	ලාත්‍රය	USD 560 (Rs.154.34)	pound 75 (Rs.199.64)
42	ආර්.පී.එල්.පී. පුෂ්පකුමාර	ගො. සං.නි. (කොස්ගම)	Seminar on Food Safety Inspection Technology for Countries along the Belt and Road	2017.06.13 - 2017.08.07	ලාත්‍රය	USD 1200	pound 75
43	පී.ඩබ්. පෙරේරා	ගො. සං.නි. (නයිනමඩම)	Seminar on Food Safety Inspection Technology for Countries along the Belt and Road	2017.06.13 - 2017.08.07	ලාත්‍රය	USD 1200	pound 75
44	එම්. වතුකරවත්ත	ගො. සං.නි. (කල්තොට)	Seminar on Food Safety Inspection Technology for Countries along the Belt and Road	2017.06.13 - 2017.08.07	ලාත්‍රය	USD 1200	pound 75
45	ආර්.එච්.ඩබ්.එස්. ආරියසේන	ගො. සං.නි. (මහනුවර)	Seminar on Food Safety Inspection Technology for Countries along the Belt and Road	2017.06.13 - 2017.08.07	ලාත්‍රය	USD 1200	pound 75
46	ඒ. ජී. එච්. බණ්ඩාර	ගො. සං.නි. (කුරුවිට)	Seminar on Officials from Geological and Mining Department of Asian and African Countries	2017.06.14 - 2017.07.04	ලාත්‍රය	USD 760	pound 75
47	එල්. කේ. විදානච්චි	ගො. සං.නි. (මාතර)	Seminar on Officials from Geological and Mining Department of Asian and African Countries	2017.06.14 - 2017.07.04	ලාත්‍රය	USD 760	pound 75
48	පී.එම්. ප්‍රේමනාත්	ප්‍රාදේශීය ඉංජිනේරු (නුවරඑළිය)	Training Course on Operation & Maintanance of Agricultural Machinary for Developing Countries	2017.06.28 - 2017.08.11	ලාත්‍රය	USD 1200	pound 75
49	එම්.පී.ශාන්ත ද සිල්වා	දිස්ත්‍රික් තාක්ෂණික නිලධාරි (අනුරාධපුර)	Training Course on Operation & Maintanance of Agricultural Machinary for Developing Countries	2017.06.28 - 2017.08.11	ලාත්‍රය	USD 1200	pound 75
50	එච්.එම්.පී. ගුණසේකර	යාන්ත්‍රික අධිකාරී (ප්‍රධාන කාර්යාලය)	Training Course on Operation & Maintanance of Agricultural Machinary for Developing Countries	2017.06.28 - 2017.08.11	ලාත්‍රය	USD 1200	pound 75
51	බී.ඩී.එස්.එල්. පෙරේරා	ඉංජිනේරු සහකාර(කොළඹ)	Training Course on Operation & Maintanance of Agricultural Machinary for Developing Countries	2017.06.28 - 2017.08.11	ලාත්‍රය	USD 1200	pound 75

52	එල්. ඒකනායක	ඉංජිනේරු සහකාර(මහනුවර)	Training Course on Operation & Maintanance of Agricultural Machinary for Developing Countries	2017.06.28 - 2017.08.11	ලංකා	USD 1200	pound 75
53	ඩබ්.කේ. වීමලරත්න	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී(ගාල්ල)	Training Course new technology popularizing of agricultural mechanization for Developing Countries	2017.06.20 - 2017.07.19	ලංකා	USD 1200	-
54	එම්.යු.යු.කේ. රංජිත්	ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර(ගාල්ල)	Training Course new technology popularizing of agricultural mechanization for Developing Countries	2017.06.20 - 2017.07.19	ලංකා	USD 1200	-
55	ඊ.සී.බී.ජී.එන්. එලමල්දෙණිය	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී (ගාල්ල)	Training Course new technology popularizing of agricultural mechanization for Developing Countries	2017.06.20 - 2017.07.19	ලංකා	USD 1200	-
56	ඒ. ජී. ඩබ්. එන්. ඩයස්	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී(කළුතර)	Training Course new technology popularizing of agricultural mechanization for Developing Countries	2017.06.20 - 2017.07.19	ලංකා	USD 1200	-
57	බී. එම්. ඒ. වීරකෝන්	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී(කෑගල්ල)	Training Course new technology popularizing of agricultural mechanization for Developing Countries	2017.06.20 - 2017.07.19	ලංකා	USD 1200	-
58	ජී.ඒ.ඩී. ස්වර්ණලතා	නියෝජ්‍ය කොමසාරිස් (කුරුණෑගල)	2017 Seminar on Ecological & Circulatory Agriculture for the Countries along the belt & road	2017.06.29 - 2017.07.27	ලංකා	USD 1200	pound 75
59	කේ.ඒ.එස්. සුමතිපාල	ගොවිජන සංවර්ධන නිලධාරී (හම්බන්තොට)	2017 Seminar on Ecological & Circulatory Agriculture for the Countries along the belt & road	2017.06.29 - 2017.07.27	ලංකා	USD 1200	pound 75
60	එස්.එන්.එස්. ගුණරත්න	ගොවිජන සංවර්ධන නිලධාරී(අම්පාර)	2017 Seminar on Ecological & Circulatory Agriculture for the Countries along the belt & road	2017.06.29 - 2017.07.27	ලංකා	USD 1200	pound 75
61`	කේ. පී. ඒ. පී. පද්මසිරි	ගොවිජන සංවර්ධන නිලධාරී(පුත්තලම)	2017 Seminar on Oil Crops Comprehensive Technology for Developing Countries	2017.06.30 - 2017.08.28	ලංකා	USD 1200	-
62	එස්. නව්ෆාර්	ගොවිජන සංවර්ධන නිලධාරී (ත්‍රිකුණාමලය)	2017 Seminar on Oil Crops Comprehensive Technology for Developing Countries	2017.06.30 - 2017.08.28	ලංකා	USD 1200	-

63	අයි.බී.මොහොමඩ්	ගොවිජන සංවර්ධන නිලධාරී (මඩකලපුව)	2017 Seminar on Oil Crops Comprehensive Technology for Developing Countries	2017.06.30 - 2017.08.28	ලංකාව	USD 1200	-
64	කේ.ඒ.එස්. ගුණරත්න	ගොවිජන සංවර්ධන නිලධාරී(ගාල්ල)	2017 Seminar on the Utlization of Biomass Energies for Developing Countries	2017.07.05 - 2017.07.28	ලංකාව	USD 800	pound 75
65	එච්.ජී.රත්නසිරි	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර(මහනුවර)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-
66	ඒ.ඒ.පී.කේ. අධිකාරී	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර(කෑගල්ල)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-
67	එච්.සී.ජේ. සොයිසා	සංවර්ධන සහකාර(අම්පාර)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-
68	ටී.ජී.සනත්	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර (කොළඹ)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-
69	ඩී.එම්.වීමලසිරි	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර (මොණරාගල)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-
70	ඩබ්.එම්.සී.එන්. විජේරත්න	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර(බදුල්ල)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-
71	එල්.ඒ.මුණවීර	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර(ගම්පහ)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 to 2017.08.17	ලංකාව	USD 1160	-
72	බී.කේ.ජී.ඩී.එම්.එස්.දිසානායක	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර (නුවරඑළිය)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-
73	එන්.එස්.කේ. ජයසිංහ	සංවර්ධන සහකාර(රත්නපුර)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-

74	එන්.එස්.පී. නිශ්ශංක	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර (කුරුණෑගල)	2017 Seminar on Hybrid Rice for Developing countries	2017.07.11 - 2017.08.17	ලංකාව	USD 1160	-
75	ආර්.එම්. කරුණාරත්න	ඉංජිනේරු සහකාර (පොළොන්නරුව)	Training Course on Biogas Technology in the Treatment and Utilization of Agricultural Waste for Developing Countries-2017	2017.09.28 - 2017.08.04	ලංකාව	USD 1200	-
76	එස්.එන්.ජයවික්‍රම	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී (අනුරාධපුර)	Training Course on Biogas Technology in the Treatment and Utilization of Agricultural Waste for Developing Countries-2018	2017.09.28 - 2017.08.05	ලංකාව	USD 1200	-
77	ඩබ්.ඒ.ඩබ්.ඩී. විජේසූරිය	ඉංජිනේරු සහකාර (කොළඹ)	Training Course on Biogas Technology in the Treatment and Utilization of Agricultural Waste for Developing Countries-2019	2017.09.28 - 2017.08.06	ලංකාව	USD 1200	-
78	ජී.වික්‍රමසිංහ	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී(මාතර)	Training Course on Biogas Technology in the Treatment and Utilization of Agricultural Waste for Developing Countries-2020	2017.09.28 - 2017.08.07	ලංකාව	USD 1200	-
79	එන්.ජී.රූපසිංහ	දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරී(මහනුවර)	Training Course on Biogas Technology in the Treatment and Utilization of Agricultural Waste for Developing Countries-2021	2017.09.28 - 2017.08.08	ලංකාව	USD 1200	-
80	ඒ.ආර්.වික්‍රමසිංහ	ඉංජිනේරු සහකාර(හලාවත)	Geo- Informatics Applications in Rural Development	2017.07.03 - 2017.07.30	ඉන්දියාව	USD 1200	-
81	කේ.ශ්‍රීසුදරන්	ගොවි බැංකු ව්‍යාපෘති සහකාර (ප්‍රධාන කාර්යාලය)	Empowerment of Women Through Enterprises	2017.09.04 - 2017.10.27	ඉන්දියාව	USD 1200	-
82	ආර්.ඒ. සේනානායක	ප්‍රාදේශීය ඉංජිනේරු (මාතලේ)	Land and Water Management	July – December 2017	චීනය	USD 1200	-

1.1.5. විනය කටයුතු.

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ආරම්භ කර ඇති මූලික වීමර්ශන සංඛ්‍යාව 46 කි. විධිමත් විනය පරීක්ෂණ ගණන 09 කි. විනය නියෝග 27 ක් ද, චෝදනා පත්‍ර 06 ක් ද නිකුත් කර ඇත.

1.1.6. පුහුණු හා හැකියා වර්ධන.

සමාලෝචිත වර්ෂය තුළදී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කුසලතා,ආකල්ප හා දැනුම වර්ධනය කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.පුහුණු හා හැකියා වර්ධන වැය ශීර්ෂය යටතේ රු. 2,000,000.00 ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් වී තිබූ අතර වර්ෂය අවසාන වන විට රු.1,625,024.61 ක මුදලක් වැය කර තිබුණි.

අනු අංකය	නිලධාරියාගේ නම	තනතුර	අනුයුක්ත කළ අංශය	පුහුණු පාඨමාලාවේ නම	පැය ගණන/ දින ගණන	පැවැත්වූ ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
1	-	ජ්‍යෙෂ්ඨ තාක්ෂණ නිලධාරීන් හා දිස්ත්‍රික්ක කාර්යාලවලට අනුයුක්ත සංවර්ධන නිලධාරීන්	-	**2016/2017** සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු යාවත්කාලීන කිරීම හා ප්‍රමුඛතා ලැයිස්තු පරිගණකගත කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන	2017.01.30 හා 31	පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	50
2	-	අදාළ වැඩසටහන මෙහෙයවන නිලධාරීන්	-	කුඹුරු ඉඩම් නාමලේඛන ප්‍රතිශෝධනය	2017.02.21	පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	65
3	**චමීල ගුරුසිංහ මයා**	රාජ්‍ය කළමනාකරණ සහකාර	-	දමිළ භාෂා ඩිප්ලෝමා පාඨමාලාව	පැය 100	මානව සම්පත් අභිවර්ධන ආයතනය	-
4	ප්‍රදීප් චිත්‍රමසිංහ **මයා**	කාර්යාල කාර්ය සහායක	-	කාර්යාල කාර්ය සහායක **පුහුණු** පාඨමාලාව	දින **02**	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	-
5	**ඩබ්. කේ. රණසිංහආරච්චි මිය**	සහකාර කොමසාරිස් ආයතන	-	ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධිය හැදෑරීම	-	කොළඹ විශ්ව විද්‍යාලය	-
6	-	දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර කොමසාරිස් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	-	ගොවිජන සංවර්ධන සහා පිහිටුවීම සම්බන්ධ වැඩමුළුව	2017.04.20 **හා 21**	සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, මහනුවර	60

7	-	ඉංජිනේරුවරුන් , තාක්ෂණ නිලධාරීන්	-	ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරීන්ගේ **II** වන දෙපාර්තමේන්තු පරීක්ෂණය	2017.06.05 06, හා 07	පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	35
8	-	ගණකාධිකාරිවරුන්, මාණ්ඩලික සහකාර ඇතුළු ප්‍රධාන කාර්යාලයේ දිස්ත්‍රික්ක වලට අනුයුක්ත විෂය භාර නිලධාරීන්	-	**CIGAS පුහුණු වැඩසටහන**	2017.08.21	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	85
9	-	ගණකාධිකාරිවරුන්, මාණ්ඩලික සහකාර ඇතුළු ප්‍රධාන කාර්යාලයේ දිස්ත්‍රික්ක වලට අනුයුක්ත විෂය භාර නිලධාරීන්	-	අත්තිකාරම් **''බී ''** ගිණුමේ ණය ශේෂ නිරවුල් කිරීමේ වැඩමුළුව	2017.10.16	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	100
10	-	ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සියලුම විෂය භාර නිලධාරීන්	-	ආයතන කටයුතු හා කාර්යාල කළමනාකරණය	2017.11.17	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	165
11	-	ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාල වලට විගණන අංශ වලට අනුයුක්ත නිලධාරීන්	-	අභ්‍යන්තර විගණන **පුහුණු වැඩසටහන**	2017/11/23 හා 24	පිළිමතලාව, ග්‍රාම සංවර්ධන අභ්‍යාස ආයතනය	32
12	-	ජ්‍යෙෂ්ඨ ගොවිජන සංවර්ධන නිලධාරීන් උතුරු හා නැගෙනහිර පළාත්	-	කුඹුරු ඉඩම් නාමලේඛන ප්‍රතිශෝධනය පිළිබඳ **වැඩසටහන**	2017.11.06	පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	35
	-	ජ්‍යෙෂ්ඨ ගොවිජන සංවර්ධන නිලධාරීන් හා අදාළ වැඩසටහන මෙහෙයවන නිලධාරියෙකු	-	කුඹුරු ඉඩම් නාමලේඛන ප්‍රතිශෝධනය **(දිස්ත්‍රික්ක 18 ක්)**	2017.11.17	පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	65
13	කේ.ඒ.එස්. සමරජීව **මිය**	සහකාර කොමසාරිස් ආයතන	-	ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය හැදෑරීම		වයඹ විශ්ව විද්‍යාලය	
14	-	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය කොමසාරිස් හා ගණකාධිකාරීවරුන්	-	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ **පුහුණු වැඩසටහන**	2017.12.06 හා 07	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය	74
15	-	ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත සියලුම කාර්ය මණ්ඩලය	-	ඵලදායිතාවය පිළිබඳ **පුහුණු වැඩසටහන**	2017.12.15	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය	210

1.1.7. සාකච්ඡා

සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්,දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් හා දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත් වූ සාකච්ඡා පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

අනු අංකය	සාකච්ඡා වර්ගය	සහභාගි වූවන්	පැවැත්වූ දිනය	පැවැත් වූ ස්ථානය	සහාභාගි වූ සංඛ්‍යාව
01	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2017.03.10	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරය	100
02	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2017.06.09 හා 10	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරය	100
03	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2017.08.31 හා 09.01	පොතුහැර ගොවිජන සංවර්ධන ජාතික පුහුණු ආයතනය	100
04	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2017.11.10	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරය	100
05	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2017.11.21	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරය	100
06	නියෝජ්‍ය/සහකාර කොමසාරිස් සාකච්ඡාව	දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන්,ප්‍රාදේශීය ඉංජිනේරුවරුන්,දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන් හා ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්	2017.12.19	ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරය	100

1.1.8. සමාලෝචිත වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟා කර ගැනීම උදෙසා තම දායකත්වය ලබා දුන් දීප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන් පහත දක්වා ඇත.

අනු අංකය	නිලධාරියාගේ නම	ශ්‍රේණිය	අනුයුක්ත කාර්යාලය	තනතුර
ශ්‍රී ලංකා පරිපාලන සේවය				
01	එම්.ඒ.එස්.වීරසිංහ මයා 2017.02.27 දක්වා	ශ්‍රී.ලං.ප.සේ. විශේෂ	ප්‍රධාන කාර්යාලය	කොමසාරිස් ජනරාල්
	ඩී.වී. බන්දුලසේන මහතා 2017.02.27 දින සිට ඉදිරියට	ශ්‍රී.ලං.ප.සේ. විශේෂ	ප්‍රධාන කාර්යාලය	කොමසාරිස් ජනරාල්
02	එස්.ඩී.කේ.ප්‍රනාන්දු මයා	ශ්‍රී.ලං.ප.සේ. විශේෂ	ප්‍රධාන කාර්යාලය	අතිරේක කොමසාරිස් ජනරාල්
03	යූ.බී.රෝහණ රාජපක්ෂ මයා	ශ්‍රී.ලං.ප.සේ. I	ප්‍රධාන කාර්යාලය	කොමසාරිස් (මා. ස. සං.)
04	ඒ.කේ.එන්.වික්‍රමසිංහ මයා	ශ්‍රී.ලං.ප.සේ. I	ප්‍රධාන කාර්යාලය	කොමසාරිස් (සේවා)
05	ඒ.එච්.එම්.එල්.අබේරත්න මයා	ශ්‍රී.ලං.ප.සේ. I	ප්‍රධාන කාර්යාලය	කොමසාරිස් (සංවර්ධන)
06	එන්.සිවලංගම් මයා	ශ්‍රී.ලං.ප.සේ. I	මඩකලපුව	නියෝජ්‍ය කොමසාරිස්
07	ජී.ඩී.ඒ.ස්වර්ණලතා මිය	ශ්‍රී.ලං.ප.සේ. II	කුරුණෑගල	නියෝජ්‍ය කොමසාරිස්
08	ටී.ඒ.රණසිංහ මයා	ශ්‍රී.ලං.ප.සේ. III	මහනුවර	සහකාර කොමසාරිස්
09	කේ.පී.ආර්.එච්.සිල්වා මයා.	ශ්‍රී.ලං.ප.සේ. III	අනුරාධපුරය	සහකාර කොමසාරිස්
10	කේ.ඒ.එස්.සමරජීව මිය	ශ්‍රී.ලං.ප.සේ. III	ප්‍රධාන කාර්යාලය	සහකාර කොමසාරිස් (ආයතන)
11	පී.කේ.පත්බේරිය මෙය	ශ්‍රී.ලං.ප.සේ. III	ප්‍රධාන කාර්යාලය	සහකාර කොමසාරිස් (සංවර්ධන)
12	ඩී.සී.එන්.අබේසේකර මිය	ශ්‍රී.ලං.ප.සේ. III	ප්‍රධාන කාර්යාලය	සහකාර කොමසාරිස් (ගොවි බැංකු)
13	ඩබ්.කේ.රණසිංහආරච්චි මිය	ශ්‍රී.ලං.ප.සේ. III	ප්‍රධාන කාර්යාලය	සහකාර කොමසාරිස් (ආයතන)
14	වී.පී.පීටර්ස් මිය	ශ්‍රී.ලං.ප.සේ. III	ප්‍රධාන කාර්යාලය	සහකාර කොමසාරිස් (විනය)
15	ඩබ්.ඩී.ආර්.ජේ.රුදිගු මිය	ශ්‍රී.ලං.ප.සේ. III	ප්‍රධාන කාර්යාලය	සහකාර කොමසාරිස් (විනය/පුහුණු)
16	ආර්.නිශාන්තන් මයා	ශ්‍රී.ලං.ප.සේ. III	යාපනය	සහකාර කොමසාරිස්
17	බී.තේයරාදන් මයා	ශ්‍රී.ලං.ප.සේ. III	මන්නාරම	සහකාර කොමසාරිස්
18	වී. ආයකුලන් මයා	ශ්‍රී.ලං.ප.සේ. III	කිලිනොච්චිය	සහකාර කොමසාරිස්
19	එල්.ජී.සී.පී.කේ.සෝමදාස මිය	ශ්‍රී.ලං.ප.සේ. III	අම්පාර	සහකාර කොමසාරිස්
20	සී.ඒකනායක මයා	ශ්‍රී.ලං.ප.සේ. III	හම්බන්තොට	සහකාර කොමසාරිස්
21	එස්.පුනිද කුමාර් මයා	ශ්‍රී.ලං.ප.සේ. III	ත්‍රිකුණාමළය	සහකාර කොමසාරිස්
22	බී.එම්.සී.එච්.කුමාරිහාමී මෙය	ශ්‍රී.ලං.ප.සේ. III	පොළොන්නරුව	සහකාර කොමසාරිස්
23	පී.ඒ.මධුසංඛ මයා	ශ්‍රී.ලං.ප.සේ. III	මොණරාගල	සහකාර කොමසාරිස්
24	වයි.අයි.ඩී.ගුණවර්ධන මිය 2017.10.30 දක්වා	ශ්‍රී.ලං.ප.සේ. III	කොළඹ	සහකාර කොමසාරිස්
	පී.ඩබ්.එස්.එච්.සරත්චන්ද්‍ර මිය 2017.10.31 දින සිට	ශ්‍රී.ලං.ප.සේ. III	කොළඹ	සහකාර කොමසාරිස්

25	ඩබ්.ජී.සී.බී. කුමාරි මිය	ශ්‍රී.ලං.ප.සේ. III	රත්නපුරය	සහකාර කොමසාරිස්
26	පී.ජී.සෝමරත්න මයා	ශ්‍රී.ලං.ප.සේ. III	මාතලේ	සහකාර කොමසාරිස්
27	එම්.එල්.එන්. සඳමාලි මිය	ශ්‍රී.ලං.ප.සේ. III	ගම්පහ	සහකාර කොමසාරිස්
28	ඩබ්.එම්.පී.බුද්ධදාස මිය	ශ්‍රී.ලං.ප.සේ. III	පුත්තලම	සහකාර කොමසාරිස්
29	එන්.ජී.එම්.එස්.කුමාර මයා	ශ්‍රී.ලං.ප.සේ. III	නුවරඑළිය	සහකාර කොමසාරිස්
30	ඊ.වී.ඩී.බී.කේ.බී.ඇහැලේපොල මයා	ශ්‍රී.ලං.ප.සේ. III	කුරුණෑගල	සහකාර කොමසාරිස්
31	කේ.ඒ.ආර්.ධර්මසේන මිය	ශ්‍රී.ලං.ප.සේ. III	මාතර	සහකාර කොමසාරිස්
32	එච්.යූ.කේ.චතුරානි මෙය	ශ්‍රී.ලං.ප.සේ. III	ගාල්ල	සහකාර කොමසාරිස්
ගණකාධිකාරි සේවය				
33	පී.ඊ.විදානගමගේ මයා	ශ්‍රී.ලං.ග.සේ. I	ප්‍රධාන කාර්යාලය	ප්‍රධාන ගණකාධිකාරී
34	රේණුකා කොළඹගේ මිය	ශ්‍රී.ලං.ග.සේ. II	ප්‍රධාන කාර්යාලය	ප්‍රධාන අභ්‍යන්තර විගණක
35	කේ.ජී.එන්.මධුවන්ති මෙය	ශ්‍රී.ලං.ග.සේ. III	ප්‍රධාන කාර්යාලය	ගණකාධිකාරී
36	ජී.ඒ.ඩී.පී.විජේරත්න මිය	ශ්‍රී.ලං.ග.සේ. III	ප්‍රධාන කාර්යාලය	ගණකාධිකාරී
37	එම්.කේ.අයි. මදුෂානි මිය	ශ්‍රී.ලං.ග.සේ. III	ප්‍රධාන කාර්යාලය	ගණකාධිකාරී
38	කේ.සුරේෂ් කුමාර් මයා.	ශ්‍රී.ලං.ග.සේ III	යාපනය	ගණකාධිකාරී
39	එම්.ඩබ්.සී.පුෂ්පලතා මිය.	ශ්‍රී.ලං.ග.සේ III	බදුල්ල	ගණකාධිකාරී
40	ඒ. සිත්ති නකීබා මිය.	ශ්‍රී.ලං.ග.සේ III	අම්පාර	ගණකාධිකාරී
41	ජී.ටී.ඊ. දිල්රුක්ෂි මෙය.	ශ්‍රී.ලං.ග.සේ III	කළුතර	ගණකාධිකාරී
42	ඩී.පී.ඩී. සේරසිංහ මයා.	ශ්‍රී.ලං.ග.සේ III	කුරුණෑගල	ගණකාධිකාරී
43	එස්. ඥාණහරන් මයා.	ශ්‍රී.ලං.ග.සේ III	වව්නියාව	ගණකාධිකාරී
44	කේ.ධර්මසීලන් මයා.	ශ්‍රී.ලං.ග.සේ III	කිලිනොච්චිය	ගණකාධිකාරී
45	ටී. ශෂිකුමාර් මිය.	ශ්‍රී.ලං.ග.සේ III	මඩකලපුව	ගණකාධිකාරී
46	ඩබ්.ඩී.අයි.එස්.පද්මසිරි මයා.	ශ්‍රී.ලං.ග.සේ III	අනුරාධපුරය	ගණකාධිකාරී
47	එස්.රාජලක්ෂ්මි මිය.	ශ්‍රී.ලං.ග.සේ III	කිලිනොච්චිය	ගණකාධිකාරී
ඉංජිනේරු සේවය				
48	ටී.එස්.විජේවර්ධන මයා	ශ්‍රී.ලං.ඉ.සේ.I	ප්‍රධාන කාර්යාලය	ප්‍රධාන ඉංජිනේරු
49	ද.දි. ප්‍රභාත් චිතාරණ මයා	ශ්‍රී.ලං.ඉ.සේ III	ප්‍රධාන කාර්යාලය	ඉංජිනේරු (ජල කළමනාකරණ)
50	එච්.ජී.කේ.ප්‍රියශාන්ත මයා	ශ්‍රී.ලං.ඉ.සේ. III	හම්බන්තොට	ප්‍රාදේශිය ඉංජිනේරු
51	අයි.එම්.මුනාස් මයා	ශ්‍රී.ලං.ඉ.සේ. III	අම්පාර	ප්‍රාදේශිය ඉංජිනේරු
52	රියාසත් අලි මයා	ශ්‍රී.ලං.ඉ.සේ. III	මඩකළපුව	ප්‍රාදේශිය ඉංජිනේරු
53	ආර්.ඒ.සේනානායක මයා	ශ්‍රී.ලං.ඉ.සේ. III	මාතලේ	ප්‍රාදේශිය ඉංජිනේරු

1.1.10. දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන් පිලිබඳ විස්තර

අනු අංකය	නිලධාරියාගේ නම	අනුයුක්ත කාර්යාලය
01	ඩී.එම්.ටී.බී. දිසානායක මයා	මාතලේ
02	එස්.ජී.පී. සේනාධීර මයා	පුත්තලම
03	එස්.එම්.පී.කේ. වීරසේකර මැණිකේ මිය	මහනුවර
04.	ඒ.එස්.ඩබ්ලිව් දහනායක මයා	ගාල්ල
05	එච්.කේ.පී. රංජනී මිය	පොළොන්නරුව
06	එස්.එච්.ආරියපාල මයා	කුරුණෑගල
07	එච්.එම්. එරංග අතපත්තු මයා	ප්‍රධාන කාර්යාලය
08	කේ.එම්. සිරාජ් මයා	ත්‍රිකුණාමලය
09	ඩබ්ලිව් ගුණසේන මයා	රත්නපුර
10	එස්.වයි.ඩී.ඒ. සෝමවංශ මයා	අනුරාධපුර
11	ඒ.ආර්.ආර්. රාමනායක මෙය	මොණරාගල
12	ඒ. දේවප්‍රිය මිය	කෑගල්ල
13	ඩී.එම්.එස්.බී. දිසානායක මයා	බදුල්ල

1.2 පාලන අංශය.

පාලන අංශය මඟින් ඉටු කරනු ලබන ප්‍රධානම සේවාව වනුයේ දෙපාර්තමේන්තුවට ලැබෙන සියලුම සාමාන්‍ය ලිපි , ලියාපදිංචි ලිපි හා චෙක්පත් ඒ ඒ අංශ වෙත යොමු කිරීම සහ ඒ ඒ අංශවලින් ලැබෙන සියලුම ලිපි අදාළ ආයතන හා පුද්ගලයින් වෙත යැවීමට කටයුතු කිරීමයි.

ඊට අමතරව පහත සඳහන් සේවාවන් ද පාලන අංශය මඟින් ඉටුකරනු ලබයි.

- දෙපාර්තමේන්තුවේ ආරක්ෂක හා පවිත්‍රතා කටයුතු පවත්වාගෙන යෑම.
- ආංශික උපදේශක කාරක සභාවට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- අතිගරු ජනාධිපතිතුමන්ගේ උපදෙස් පරිදි ක්‍රියාවට නැංවෙන '' ජනපතිට කියන්න'' මහජන දුක් ගැනවිලි සඳහා සහන සැලසීමේ යාන්ත්‍රණයෙහි කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මහජන පෙත්සම් කාරක සභාව හා සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය හා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට අදාළ කටයුතු පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු.
- දෙපාර්තමේන්තුවේ සියලුම දුරකථන බිල්පත් , විදුලි බිල්පත්, ජල බිල්පත් පියවීම හා වරිපනම් ගාස්තු ගෙවීම.
- දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සියලුම නිලධාරීන්ගේ නිවාඩු සම්බන්ධ රාජකාරි.
- දෙපාර්තමේන්තු අභ්‍යන්තර දුරකථන පද්ධතියෙහි නඩත්තු කටයුතු සිදු කිරීම.
- නිල නිවාස කුලී අය කිරීම.
- දෙපාර්තමේන්තුව වෙත මිල දී ගනු ලබන පුවත්පත් සම්බන්ධ සියලුම රාජකාරි.
- දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා දුම්රිය අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබාදීම.
- නිදහස් දුම්රිය බලපත්‍ර ලබා දීම.
- ප්‍රධාන කාර්යාලයීය ඍජු දුරකථන පද්ධතිය නඩත්තු කිරීම.
- ගිනි නිවීමේ උපකරණ නඩත්තු කිරීම.
- රජයේ මැතිවරණවලට අදාළ රාජකාරී කටයුතු සිදුකිරීම.
- දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යය සාධන වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම.
- රජයේ නිලධාරීන්ගේ ඇප තැන්පත් නිදහස් කිරීමට අදාළ රාජකාරී කටයුතු සිදු කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශ හා සම්බන්ධ රාජකාරී කටයුතු සිදු කිරීම.
- ප්‍රධාන කාර්යාලයෙහි සියලුම ශාඛාවන්ට අවශ්‍ය භාණ්ඩ හා උපකරණ ලබා දීම.
- ප්‍රධාන කාර්යාල පරිශ්‍රයෙහි නඩත්තු කටයුතු අධීක්ෂණය කිරීම.
- රාජකාරී හැඳුනුම්පත් නිලධාරීන් වෙත නිකුත් කිරීම.
- ප්‍රධාන කාර්යාලයෙහි යතුරු රාජකාරී සම්බන්ධ සියලුම කටයුතු සිදු කිරීම.
- ජංගම අන්තර්ජාල සබඳතා සම්බන්ධ සියලුම රාජකාරී කටයුතු සිදු කිරීම.

02. සංවර්ධන හා ප්‍රගති පාලන අංශය.

2.1 සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය.

*වැය ශීර්ෂය -**281-2-2-12-2506***

2017 වර්ෂය සඳහා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ හා පුරන් කුඹුරු සංවර්ධන වැඩසටහන සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත රු. මිලියන 1000 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එයින් රු. මී. 969.2 ක මුදලක් ප්‍රතිපාදන වශයෙන් නිදහස් කරන ලදී. ඒ යටතේ දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි කර්මාන්ත 1154 ක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද නමුත් ගිවිසුම් ගත වී ඇති කර්මාන්ත ගණන 909 කි . එම කර්මාන්තයන්ගෙන් කර්මාන්ත 716 ක වැඩ අවසන් කර ඇත. මෙහි ඇස්තමේන්තු ගත වටිනාකම රු. මී. 853.7 ක් වන අතර ඒ සඳහා රු. මී. 184 ක වියදමක් දරා ඇත. මෙහි අතැති බිල්වල වටිනාකම රු. මී. 524.5ක් වේ. මෙහි බැඳීම් රු. මී 252.1 ක් වේ . ඒ අනුව මූල්‍ය ප්‍රගතිය 71% කි . භෞතික ප්‍රගතිය 62% ක් වේ. **(ඇමුණුම 01 හි පිටු අංක 59)**

*වැය ශීර්ෂය - **118 -2-3-40-2506***

මෙම වැඩසටහන සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ වැය ශීර්ෂ 118-2-3-40-2501 යටතේ විශේෂ ව්‍යාපෘති (කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය) සඳහා රු. මී. 3000 ක ප්‍රතිපාදන වෙන් වූ අතර වෙන් කල ප්‍රතිපාදන ප්‍රමාණයම නිදහස් කරන ලදී. ඒ යටතේ දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි කර්මාන්ත 2316 ක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වූ නමුත් ගිවිසුම් ගත වී ඇති කර්මාන්ත ගණන 2040 කි. මෙම කර්මාන්තයන්ගෙන් වැඩ අවසන් කල කර්මාන්ත ගණන 1123 කි. මෙහි ඇස්තමේන්තු වටිනාකම රු. මී. 2689.4 කි . ඒ සඳහා රු. මී. 524.6 ක වියදමක් දරා ඇත. මෙහි අතැති බිල්වල වටිනාකම රු. මී. 1413.5 ක් වන අතර බැඳීම් රු. මී. 498.6 ක් වේ. භෞතික ප්‍රගතිය 77% ක් සහ මූල්‍ය ප්‍රගතිය 65% ක් වේ. **(ඇමුණුම 01 හි පිටු අංක 62)**

2.2 බෝග විවිධාංගීකරණය.

*වැය ශීර්ෂය -**281-2-2-10-2507***

බෝග විවිධාංගීකරණය වැඩසටහන සඳහා ඉහත වැය ශීර්ෂය යටතේ මෙම දෙපාර්තමේන්තුව වෙත රු. මී. 50 ක් වෙන් කරන ලදී . එයින් රු .මී 49.5 ක ප්‍රතිපාදන , කර්මාන්ත 628 ක් සඳහා නිදහස් කරන ලදී. මේ යටතේ දිස්ත්‍රික්ක 04 ක් (පුත්තලම, කුරුණෑගල, අනුරාධපුරය, මඩකලපුව) ආවරණය විය.
මෙහි ගිවිසුම් ගත මුදල රු. 3,796,270.00 ක් වන අතර අතැති බිල්වල වටිනාකම රු. මී. 1.545 කි. මඩකලපුව ව්‍යාපෘතිය පමණක් ක්‍රියාත්මක වූ අතර එහි භෞතික ප්‍රගතිය 0.15% කි. **(ඇමුණුම 01 හි පිටු අංක 62) (ඇමුණුම 10)**

2.3 ගොඩනැගිලි පුනරුත්ථාපනය.

වැය ශීර්ෂය ***281-2-2-0-2001***

ගොවිජන සේවා මධ්‍යස්ථාන පුනරුත්ථාපනය සඳහා රු .මි.100 ක ප්‍රතිපාදන වෙන් වූ අතර වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණයම නිදහස් කරන ලදී. මේ යටතේ දිස්ත්‍රික් 25 ම ආවරණය වන පරිදි ගොවිජන සේවා මධ්‍යස්ථාන අළුත්වැඩියාවන් සඳහා කර්මාන්ත 74 ක් හඳුනා ගන්නා ලදී. මෙහි මුළු ඇස්තමේන්තු වටිනාකම රු. මි. 107 කි. ගිවිසුම් ගත වී ඇති කර්මාන්ත ගණන 67 ක් වේ. දරා ඇති වියදම රු. මි. 40.9 කි. අතැති බිල්වල වටිනාකම රු. මි. 50.9 ක් වන අතර මෙහි බැඳීම් රු. මි. 7.7 ක් වේ.මූල්‍ය ප්‍රගතිය 92% ක් වන අතර මෙහි භෞතික ප්‍රගතිය 72% ක් වේ. **(ඇමුණුම 01හි පිටු අංක 63)**

2.4 ප්‍රධාන කාර්යාල සහ දිස්ත්‍රික් කාර්යාල අලුත් වැඩියාව.

වැය ශීර්ෂය ***281-1-1-0-2001***

2017 වසරේ ප්‍රධාන කාර්යාලය සහ දිස්ත්‍රික් කාර්යාල අලුත්වැඩියාව සඳහා රු. මි. 25 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රමාණයම නිදහස් කරන ලදී. මෙහිදී දිස්ත්‍රික්ක 14 ආවරණය වන පරිදි සිදු වූ කර්මාන්ත ගණන 20 ක් වන අතර ගිවිසුම් ගත වී තිබූ කර්මාන්ත සංඛ්‍යාව 715 කි . මෙහි මුළු ඇස්තමේන්තු වටිනාකම රු. මි. 24.4 ක් වන අතර මේ සඳහා දරා ඇති වියදම රු. මි. 12 ක් වේ . අතැති බිල්වල වටිනාකම රු. මි. 6 ක් වන අතර මෙහි බැඳීම රු. මි. 6.9 ක් වේ . මෙම වැඩසටහනෙහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පිළිවෙලින් 72% ක් හා 75% ක් වේ. **(ඇමුණුම 01 හි පිටු අංක 63)**

2.5 ගොඩනැගිලි ඉදිකිරීම.

වැය ශීර්ෂය ***281-2-2-0-2104***

මෙම වැඩසටහන සඳහා රු. මි. 39.5 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රමාණයම නිදහස් කරන ලදී. දිස්ත්‍රික් 12 ක් අවරණය වන පරිදි කර්මාන්ත 15 ක් හඳුනා ගන්නා ලද අතර එයින් ගිවිසුම් ගත වී ඇත්තේ කර්මාන්ත 14 කි. මෙහි මුළු ඇස්තමේන්තු වටිනාකම රු. මි. 47.16 ක් වූ අතර එහි වියදම රු. මි. 9. ක් වේ. අතැති බිල්වල වටිනාකම රු. මි. 19.0 ක් වන අතර මෙහි බැඳීම් රු. මි. 5.4 ක් වේ. මෙහි භෞතික ප්‍රගතිය 86% ක් වන අතර මූල්‍ය ප්‍රගතිය 71% ක් වේ. **(ඇමුණුම 01 හි පිටු අංක 63)**

2.6 යන්ත්‍ර පුනරුත්ථාපනය.

වැය ශීර්ෂය ***281-2-2-0-2002***

මෙම වැය ශීර්ෂය යටතේ රු .මි . 07 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රතිපාදනවලින් යන්ත්‍ර පුනරුත්ථාපනය සඳහා රු. 6,567,723.48 ක වියදමක් දරා ඇත.

2.7 යන්ත්‍ර අත්පත් කර ගැනීම.

වැය ශීර්ෂය ***281- 2 -2-0- 2103***

මෙම වැය ශීර්ෂය යටතේ රු. මි. 02 ක ප්‍රතිපාදන වෙන් වූ අතර එම ප්‍රතිපාදන වලින් රු. 1,274,991.20 ක වියදමක් දරා ඇත.

2.8 යන්ත්‍ර සේවා සැපයීම.

2.8.1 යාන්ත්‍රික අංශය (දෙපාර්තමේන්තුව සතු ඩෝසර් /එක්ස්කැවේටර් යන්ත්‍ර)

සංවර්ධන හා ප්‍රගති පාලන අංශයේ යන්ත්‍ර සම්බන්ධව කටයුතු කරන යාන්ත්‍රික අංශය මේ වන විට යාන්ත්‍රික අධිකාරිවරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ .

2017.01.01 ට අප දෙපාර්තමේන්තුව සතුව තිබූ යන්ත්‍ර පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ජපන් යන්ත්‍ර

01. එක්ස්කැවේටර් යන්ත්‍ර	-	04
02. මිනි එක්ස්කැවේටර් යන්ත්‍ර	-	02
03. ඩෝසර් යන්ත්‍ර	-	14
04. කූඩි පස් තලන රෝලර්	-	02
එකතුව	-	22

චීන යන්ත්‍ර

01. එක්ස්කැවේටර් යන්ත්‍ර	-	07
02. වීල් ලෝඩර්	-	03
03. බැකෝ ලෝඩර්	-	05
04. බුල් ඩෝසර්	-	09
05. වයිබ්‍රේටර් රෝලර්	-	04
06. මෝටර් ග්‍රේඩර් යන්ත්‍ර	-	01
එකතුව	-	29
මුළු එකතුව	-	**51**

ජපන් ආධාර යටතේ ලබා දුන් යන්ත්‍රවලින් ක්‍රියාකාරී නොවන යන්ත්‍ර 05 ක් (DAS 26, DAS 27, DAS 28, DAS 34, DAS 45) අපහරණය කිරීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව දෙපාර්තමේන්තුව සතුව ක්‍රියාකාරී මට්ටමේ මුළු යන්ත්‍ර ප්‍රමාණය 46 කි.

මෙම යන්ත්‍ර ප්‍රමාණය පහත දැක්වෙන පරිදි ප්‍රාදේශිය යාන්ත්‍රික ඒකකවලට අනුයුක්ත කර ඇත.

අනු අංකය	ස්ථානය	චීන යන්ත්‍ර	ජපන් යන්ත්‍ර	එකතුව
01	මාලඹේ	01	02	03
02	මහව	09	06	15
03	හම්බන්තොට	04	04	08

04	මොණරාගල	01	04	05
05	අනුරාධපුරය	14	01	15
	එකතුව	**29**	**17**	**46**

2.8.2 ආදායම් විස්තර - 2017

මෙම යන්ත්‍රවලින් 2017 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුව වෙත ලැබී ඇති ආදායම **රු. 10,369,745 .00** ක් වේ .

01. හම්බන්තොට - රු. 3,170,310.00
02. මොණරාගල - රු. 576,815.00
03. අනුරාධපුරය - රු. 2,484,635.00
04. කුරුණෑගල - රු. 4, 055,985.00
05. කොළඹ - රු. 82,000.00

මෙම යන්ත්‍ර 2017 වර්ෂයේදී ක්‍රියාකර ඇති සේවා මීටර් පැය ගණන 4500 ක් පමණ වේ .ඒ අනුව ඉටු කර ඇති කර්මාන්තවල වටිනාකම ආසන්න වශයෙන් රු. මී. 27 ක් වේ . (සේවා පැයක වටිනාකම රු . 6000 .00 ක් වන ලෙස අදාළ ගණනය කිරීම් කර ඇත.)

2.9 ගොවීන්ගේ භාරකාර අරමුදල.

2.9.1 කෘෂිමාර්ග.

අම්පාර දිස්ත්‍රික්කයේ 2016 වර්ෂයේ හා 2017 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 02 ක් ඇස්තමේන්තු වටිනාකම රු. 5,999,500.00 ක් වේ. මෙහි මේ වන විට රු. 3,696,615.69 ක මුදලක් සඳහා පියවීම් කර ඇති අතර එක් ව්‍යාපෘතියක වැඩ අවසන් කර ඇත. **(ඇමුණුම 02)**

අනුරාධපුරය දිස්ත්‍රික්කයේ 2017 වර්ෂයේ ආරම්භ කල ව්‍යාපෘති 04 ක් ඇති අතර එහි අනුමත මුළු ඇස්තමේන්තු මුදල රු. 5,650,000.00 වන අතර මේ වන විට පියවා ඇති මුදල රු.1,917,995.87කි. මෙහි එක් ව්‍යාපෘතියක පමණක් වැඩ අවසන් කර ඇති අතර අනෙක් කර්මාන්ත දෙකෙහි ප්‍රගතිය 70% කි. **(ඇමුණුම 03)**

මාතර දිස්ත්‍රික්කයේ රු. මී. 12 ක ප්‍රතිපාදනයන් යටතේ ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක වූ අතර එහි මුළු ඇස්තමේන්තු වටිනාකම රු. 14,160,000.00 වේ. මෙහි මුළු වියදම රු. 11,974,173.33 වේ. සියලු කර්මාන්තයන්ගේ වැඩ අවසන් කර ඇත. **(ඇමුණුම 06)**

2.9.2 සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ පළමු අදියර ලෙස 2016 වර්ෂයේ ක්‍රියාත්මක වූ වැව් දෙකක වැඩ අවසන් කර ඇති අතර මෙහි ගිවිසුම් ගත මුලු වටිනාකම රු. 3,612,503.92 කි. භෞතික ප්‍රගතිය 100% ක් වන අතර ලබාගත් අත්තිකාරම් පියවා ඇත. එසේම 2017 වර්ෂයේ ආරම්භ කරන ලද ව්‍යාපෘති 04 ක් ඇති

අතර එහි ගිවිසුම් ගත මුළු වටිනාකම රු.17,274,088.93 වේ. මෙහි එක් ව්‍යාපෘතියක භෞතික ප්‍රගතිය 100% වන අතර අනෙක් ව්‍යාපෘති ක්‍රියාත්මක මට්ටමේ පවති.රු.5,301,000.00 ක් අත්තිකාරම් ලෙස පියවා ඇත. **(ඇමුණුම 04)**

මාතර දිස්ත්‍රික්කයේ විශේෂ ව්‍යාපෘති වශයෙන් සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය යටතේ ව්‍යාපෘති 03 ක් සිදු කරන ලද අතර එහි මුළු ඇස්තමේන්තු වටිනාකම රු. 5,035,000.00 කි. මුළු වියදම රු. 4,348050.37 ක් වේ. මෙහි මූල්‍ය ප්‍රගතිය 100% ක් වන අතර කර්මාන්ත 03හි ම වැඩ අවසන් කර ඇත. එසේම මාතර දිස්ත්‍රිකකයේ 2015 වර්ෂයේ සිට ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක ගිවිසුම් ගත වටිනාකම රු. 3,439,527.00 කි. 2016.08.31 දින වන විට කර්මාන්තයේ වියදම රු. 3,244,534.80ක් වේ. මෙහි වැඩ අවසන් කර ඇත. එසේම දෙවිනුවර කොට්ඨාශය තුළ ව්‍යාපෘති 04 ක් ක්‍රියාත්මක වූ අතර මේ සඳහා වෙන් කල ප්‍රතිපාදන මුදල රු. 3,489,382.58 ක් වන අතර මෙහි වියදම රු. 3,361,155.85 ක් වේ. මෙහි වැඩ අවසන් කර ඇත. **(අමුණුම් 5-1,5-2,5-3)**

මාතර දිස්ත්‍රික්කයේ රු. මී. 19 ක ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘති 34 ක් ක්‍රියාත්මක වූ අතර මෙහි ඇස්තමේන්තුගත මුළු වටිනාකම රු.23,176,000.00 ක් වන අතර මුළු වියදම රු.17,996,711.68ක් වේ. මෙහි සියලු කර්මාන්තයන්ගේ වැඩ අවසන් කර ඇත. **(ඇමුණුම 07)**

2.9.3 පොහොර ගබඩා ඉදි කිරීම.

2017 වර්ෂයේ ගොවීන්ගේ භාරකාර අරමුදලට ඉල්ලීම් ලැබුණු නමුත් ප්‍රතිපාදන ලබාදීමක් සිදු නොවීය. ගොවීන් වෙත පොහොර බෙදා දීම වෙනුවට මුදල් ලබා දීම හේතුවෙන් මෙම වසර තුළ පොහොර ගබඩා ඉදිකිරීමක් සිදු නොවුනි.

2.10 ගොවිජන සංවර්ධන අරමුදල.

ගොවිජන සංවර්ධන අරමුදලින් මධ්‍යස්ථාන වල සැපයුම වැඩිදියුණු කිරීම හා සංවර්ධනය කිරීම යටතේ අලෙවි සැල් සංවර්ධනය කිරීම සඳහා රු. මී. 4.00 ක් වෙන් වූ අතර එයින් රු.6,540,764.90 ක මුදලක් ලබා දෙන ලදී. එහිදී දිස්ත්‍රික්ක 06 ක් ආවරණය වන පරිදි මධ්‍යස්ථානයන් 07 ක කර්මාන්ත සඳහා අත්තිකාරම් ලබා දුන් අතර එහි මුළු වියදම රු.3,160,118.10 ක් වේ. (සංවර්ධන අරමුදල මඟින් සේවා අංශය වෙත වෙන් වූ ප්‍රතිපාදන වලින් රු. මී. 04 ක් ලබා ගැනීමට සිදුවිය. එයට හේතුව වනුයේ 2016 වසරේ අත්තිකාරම් මෙම වසරේ පියවීම වේ.) සියලු කර්මාන්තයන්හි වැඩ අවසන් කර ඇත**. (ඇමුණුම 08)**

ගොඩනැගිලි, වාහන සහ උපකරණ නඩත්තු කිරීම හා අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු. මී. 10.00 ක් වෙන් කරන ලද අතර එයින් රු.9,673,927.98 ක් ලබා දුන් අතර ලැබී ඇති ඉල්ලීම් අනුව (2016 වර්ෂයේ අත්තිකාරම් පියවීම මෙම වසරේ සිදු වූ බැවින් එම පියවීම් මෙම වසරේ වෙන් කරන මුදලින් පියවනු ලැබේ) එම මුදල ප්‍රමාණවත් නොවිණි. එහිදී සංවර්ධන අරමුදලින් සේවා අංශය වෙත වෙන් කළ මුදලින් ඔවුන්ගේ වියදම් දරා ඉතිරිව තිබූ මුදල් ද ඇතුළත්ව දිස්ත්‍රික්ක 13 ක් ආවරණය වන පරිදි කර්මාන්ත 19 ක් සඳහා අත්තිකාරම් ලබා දුන් අතර එහි මුළු වියදම රු .10,098,445.87වේ . කළුතර හැර අනෙකුත් සියලු කර්මාන්ත වැඩ අවසන් කර ඇත **. (ඇමුණුම 09)**

2.11 ඉඩම් අත්පත් කර ගැනීම.

2017 වසරේ ද දෙපාර්තමේන්තුව වෙත පැවරී නොමැති ගොවිජන සේවා මධ්‍යස්ථාන පිහිටි ඉඩම් හා සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය සඳහා අවශ්‍ය ඉඩම් පවරා ගැනීමට කටයුතු සිදු කෙරුණි . මෙහිදී ඉඩම් පවරා ගැනීමේ ක්‍රියාවලිය සඳහා දීර්ඝ කාලයක් ගතවීම හා නිරන්තර විරෝධතා මතුවීම නිසා මෙම කාර්ය අඛණ්ඩව සිදු වෙමින් පවතී.

2.12 අලුත් සහල් මංගල්‍යය.

අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියසදී **50 වන** වරටත් ජාතික අලුත් සහල් මංගල්‍යය අප්‍රේල් මස 07 හා 08 යන දිනයන්හි දී උත්සවාකාරයෙන් පවත්වන ලදී . ලක්වාසී ගොවි ජනතාවගේ අභිවෘද්ධිය අපේක්ෂාවෙන් “ කලට වැසි වසීවා - කෙත් වතු සාර වේවා’’ යන තේමාව යටතේ ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ මහ පෙන්වීම හා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ උපදෙස්, 2017 අලුත් සහල් මංගලෝත්සවයේ සාර්ථකත්වයට මනා පිටිවහලක් විණි . මෙම ජාතික උත්සවය ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා ගුවන් විදුලි සංස්ථාව මඟින් සජීවීව ප්‍රචාරය කිරීමට පෙර වසර වල දී මෙන්ම මෙවර ද කටයුතු කරන ලදී.

දිවයිනේ ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා එක් රැස් කර භාරදුන් සහල් මෙදින පූජා කරන ලද අතර ඒ සඳහා අවශ්‍ය සහල් සහ මුදල් ආධාර ලබා දීමට දිවයින පුරා පිහිටි ගොවි සංවිධාන විසින් සිදුකරන ලදී. මෙම අලුත් සහල් මංගල්‍යය සාර්ථක කර ගැනීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියලුම ආයතනයන් ද, විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා මෙන්ම උතුරු මැද පළාත් සභාව, අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා පෞද්ගලික ආයතනයන් ද විශාල දායකත්වයක් ලබා දෙන ලදී. මෙහිදී අලුත් සහල් මංගල්‍යය නිමිති කරගත් සමරු ග්‍රන්ථයක් ද එළි දක්වන ලදී.

මේ සඳහා වැය ශීර්ෂය 281-2-2-0-1409 යටතේ රු. මි 2.00 ක් අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය වෙත ලබා දී ඇති අතර ඉන් රු .1,907,547.23 ක වියදම් දරා ඇත . ඊට අමතරව ගොවි භාරකාර අරමුදල යටතේ රු. මි. 3.00ක් ලබා දුන් අතර මාධ්‍ය කටයුතු සඳහා ඉන් රු. 2,990,726.80 ක වියදමක් දරා ඇත . එසේම 281 -2-2-0-1409 වැය ශීර්ෂය යටතේ ප්‍රධාන කර්යාලය තුළින් රු. 1,040,023.80 ක වියදමක් දරා ඇත. ඒ අනුව 2017 ජාතික අලුත් සහල් මංගල්‍ය සඳහා වන සමස්ත වියදම රු. 5,938,297.83 කි .

03. ඉංජිනේරු අංශය.

3.1 කාර්යයන් :

දෙපාර්තමේන්තුව මඟින් සිදුකරනු ලබන සුළු වාරිමාර්ග, ගොවිජන සේවා මධ්‍යස්ථාන හා දිස්ත්‍රික් කාර්යාල ඉදිකිරීම් හා ගොඩනැගිලි අලුත්වැඩියාවන් පිළිබඳ ඇස්තමේන්තු අනුඥාත කිරීම, ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා තාක්ෂණ වාර්තා සකස් කිරීම මෙම අංශය මඟින් මූලිකව සිදුකරනු ලබන කාර්යයන් වන අතර බාහිර ආයතන වලින් ඉදිරිපත් කරන පාරිසරික තාක්ෂණ ඇගයීම් පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂණ හා අදාළ වාර්තා සැපයීම ද සිදු කරනු ලබයි. විශේෂයෙන්ම මෙම අංශයේ රාජකාරීන් සංවර්ධන අංශයේ ක්‍රියාකාරී සැලැස්ම මත ක්‍රියාත්මක වේ.

3.2 2017 වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලයේ සිදුකරන ලද කාර්යයන්.

- දෙපාර්තමේන්තුවේ 60 වන සංවත්සරය නිමිත්තෙන් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ තීන්ත ආලේප කිරීම හා අනෙකුත් අළුත්වැඩියා කටයුතු සිදු කිරීම.
- ප්‍රධාන කාර්යාලය සඳහා නව නාම පුවරුවක් සකස් කර සවි කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ ජල ටැංකි නවීකරණය කිරීම.
- ප්‍රධාන කාර්යාලයේ පිටත කාණු පද්ධතිය අළුත්වැඩියා කිරීම.
- ප්‍රධාන ගණකාධිකාරී නිල නිවසේ විදුලිය විසන්ධි වීම හේතුවෙන් අළුත්වැඩියා කිරීම.
- 70MA සිට 400MA දක්වා විදුලි ධාරිතාවය වැඩිකර ප්‍රධාන කාර්යාලයේ විදුලි පද්ධතිය නවීකරණය කිරීම.

04. ආයතනික සංවර්ධන අංශය.

අරමුණ හා වගකීම

ගොවි ජනතාවගේ කෘෂිකාර්මික අවශ්‍යතා සපුරාදීම මඟින් ඔවුන්ගේ ආර්ථිකමය හා සමාජයීය පසුබිම ශක්තිමත් කිරීම අරමුණු කොට මැදිහත්කරුවෙකුගේ භූමිකාව ඉටුකිරීම පිණිස සමස්ත ගොවිජන සේවා මධ්‍යස්ථාන ජාලය මෙහෙයවීම සඳහා 2017 වර්ෂය තුළ මෙම අංශය වෙතින් ඉටුකරන ලද කාර්යභාරය ඒ ඒ විෂයයන් ඔස්සේ පහත සඳහන් පරිදි පෙළ ගස්වනු ලැබේ.

4.1 ගොවිජන සේවා මධ්‍යස්ථාන අධීක්ෂණය.



4.1.1 ගොවිජන සේවා මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා ලැබීම.

ගොවිජන සේවා මධ්‍යස්ථාන අධීක්ෂණයට අදාළව පරීක්ෂණ වාර්තා නියමිත පරිදි ප්‍රධාන කාර්යාලය වෙත එවීමට කටයුතු කරන ලෙස සියලුම දිස්ත්‍රික් නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් වෙත දන්වා යවා ඇත. ඒ අනුව මෙම වර්ෂයේ දී ගොවිජන සේවා මධ්‍යස්ථාන පරීක්ෂණ වාර්තා 384 ක් ඉදිරිපත් වී ඇත.

4.1.2 ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් සේවා සැපයීම.

ගොවි ජනතාවට අවශ්‍ය බීජ හා රෝපණ ද්‍රව්‍ය, පැළ වර්ග, කෘෂි උපකරණ හා වෙනත් අවශ්‍ය කෘෂිකාර්මික ද්‍රව්‍ය ගොවිජන සේවා මධ්‍යස්ථාන මඟින් සපයා දීම හා ඒ මඟින් ආදායම් ඉපයීමට කටයුතු කර ඇත.

4.2 පොදු මුදල්/අක්කර බදු/කුවිතාන්සි පොත් සහ මුදල් පොත් සැපයීම

ඇණවුම් කර ඇති පොත් ගබඩාවේ තොග අවසන් වන්නට පෙර නැවත මුද්‍රණය කිරීමට කටයුතු කිරීම හා අවශ්‍යතාව පරීදි දිස්ත්‍රික් කාර්යාල වෙත බෙදා හැරීම මෙම අංශය මඟින් සිදුකරනු ලැබේ. ඒ අනුව 2017 වසරේ කුවිතාන්සි පොත් අලෙවිය පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

වර්ගය	පොත් ප්‍රමාණය	මුදල (රු.)
පොදු මුදල් කුවිතාන්සි පොත්	8473	423,650.00
අක්කර බදු කුවිතාන්සි පොත්	9070	453,500.00
කම්ටු මුදල් කුවිතාන්සි පොත්	85	110,500.00
එකතුව	**17628**	**987,650.00**

4.3 ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන

ආහාර නිෂ්පාදන ජාතික වැඩසටහන 2016-2018 තුන් අවුරුදු සැලැස්ම යටතේ දිවයින පුරා ගම්මාන වල " **සිතමු** " කාන්තා ගොවි සංවිධාන 25000 ක් පමණ පිහිටුවන ලද අතර, ඒ අතරින් 23,702 ක් පමණ ලියාපදිංචි කර ඇත.

මේ වනවිට ප්‍රතිලාභී කාන්තාවන් 583,095 ක් ගෙවතු වගා වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබාගෙන ඇත. එසේම පළතුරු ගම්මාන වැඩසටහන යටතේ ප්‍රසම්පාදිත ආයතන මඟින් තෝරාගත් ගම්මානයන්හි ප්‍රතිලාභීන් වෙත මේ වනවිට පළතුරු පැළ බෙදා හැරීමට කටයුතු කර ඇත.
(ඇමුණුම 11)



4.4 ආහාර නිෂ්පාදන සංග්‍රාමය 2017-2020



පසුගිය කන්න කිහිපය තුළ (2016-2017) පැවති ගංවතුර හා නියං තත්ත්වයන් හේතුවෙන් රටේ ආහාර නිෂ්පාදන ක්‍රියාවලියට ඇති වූ බලපෑම් මඟහරවා ගනිමින් 2017/2018 මහ කන්නය ආහාර නිෂ්පාදනයේ නව ප්‍රබෝධයක් ඇති කර ආහාර නිෂ්පාදනය වැඩි කිරීමේ ක්‍රියාවලිය නැවත ආරම්භ කිරීමේ අවශ්‍යතාව මතුව ඇත. ඒ අනුව අතිගරු ජනාධිපතිතුමා විසින් **"ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමය"** ප්‍රකාශයට පත් කොට කෘෂිකර්ම ක්ෂේත්‍රය සහ ඊට අනුබද්ධ සියලු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන, ගොවි ප්‍රජාව මෙන්ම පෞද්ගලික අංශයේ ද දායකත්වයෙන් කඩිනම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දුනි. එහි ආරම්භක සතිය ලෙස 2017 ඔක්තෝබර් මස 06 වන දින සිට 12 වන දින දක්වා කාලය නම් කරන ලදී.

මෙම වැඩසටහනට සමගාමී ව දිවයින පුරා පුරන් වී ඇති කුඹුරු අක්කර 130,000 ක් නැවත වගා කරවීම සඳහා රජය විසින් තීරණය කරන ලද අතර පුරන් කුඹුරු අක්කර 15,058 ක පමණ ප්‍රමාණයක් වගා කරන ලදී.

එම සතියට සමගාමීව **සි**ත**මු** කාන්තා ගෙවතු ලක්ෂ 5 ක් ස්ථාපිත කිරීම, කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින සියලුම ආයතන වල හා කාර්ය මණ්ඩල නිවාස වල ගෙවතු ස්ථාපිත කිරීම, සුළු වාරි මාර්ග, කෘෂි මාර්ග හා වගා ළිං ප්‍රතිසංස්කරණය කිරීම,තෝරාගත් පාසල් 100 ක ගෙවතු ස්ථාපිත කිරීම, 50% ක දායකත්වය යටතේ බීත්තර වී, බඩ ඉරිඟු බීජ ගොවීන් වෙත ලබා දීම, ආගමික සිද්ධස්ථාන සඳහා පොල් පැළ බෙදා දීම ආදී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ සඳහා රු. 5,029,847.50 ක පමණ මුදලක් වැය විය.

පුරන් කුඹුරු නැවත වගා කිරීමේ වැඩ සටහන - **2017**

අනු අංකය	දිස්ත්‍රික්කය	මුළු පුරන් කුඹුරු අක්කර ප්‍රමාණය	කුඹුරු ඉඩම් කැබලි සංඛ්‍යාව	වගා කර ඇති මුළු පුරන් කුඹුරු අක්කර
1	කොලඹ	6454	5825	491
2	ගම්පහ	8366	11333	2332.25
3	කළුතර	16280	17689	2092
4	ගාල්ල	12767	13621	1814.3
5	මාතර	11966	6309	817.8
6	හම්බන්තොට	1311	170	5.5
7	බදුල්ල	1574	1898	218
8	මොණරාගල	183	0	0
9	රත්නපුර	11147	11333	1568
10	කෑගල්ල	7132	10737	2210.55
11	කුරුණෑගල	3309	2909	353
12	පුත්තලම	4669	1810	349
13	මහනුවර	11297	7218	960
14	මාතලේ	861	1733	244.7
15	නුවරඑලිය	895	1484	176.5
16	අනුරාධපුරය	0	0	0
17	පොළොන්නරුව	0	0	0
18	ත්‍රිකුණාමලය	3157	0	0
19	වව්නියාව	5323	0	0
20	මුලතිව්	5615	2029	1425.5
21	කිලිනොච්චි	4589	0	0
22	මන්නාරම	4564	0	0
23	අම්පාර	968	0	0
24	මඩකලපුව	3941	0	0
25	යාපනය	4496	0	0
	එකතුව	**130864**	**96098**	**15058.1**

4.5 අක්කර බදු අයකිරීම.

ගොවිජන සංවර්ධන අරමුදලට 2017 වර්ෂයේදී අක්කර බදු 20% දායක මුදල් වශයෙන් රු. 28,872,876/- ක් ලැබී ඇත.

4.6 2KR - ජපන් යෙන් ආධාර යටතේ ට්‍රැක්ටර් බෙදාහැරීම හා කළමනාකරණය.



4.6.1 ට්‍රැක්ටර් වාරික අයකිරීම

2KR ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ කෘෂිකර්ම අමාත්‍යාංශය හරහා ලැබී, මෙම දෙපාර්තමේන්තුව මඟින් 2012 වර්ෂය දක්වා බෙදාහරින ලද ට්‍රැක්ටර්/කෘෂි උපාංග වෙනුවෙන් 2017 වර්ෂය තුළ දී අයකරන ලද වාරික මුදල් දිස්ත්‍රික්කවලින් ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇත.

ඒ අනුව පහත දැක්වෙන පරිදි අදාළ වාරික මුදල් ප්‍රමාණයන් ගොවිජන සංවර්ධන අරමුදලට බැර කර ඇත

- **රෝද 02 ට්‍රැක්ටර් වාරික මුදල්** (රු.)

• 1992-2006 වර්ෂ තුළ ගොවි සංවිධාන වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා	-	484,521.75
• 2008 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා	-	2,540,472.00
• 2010 වර්ෂයේ නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා	-	6,515,905.00
• 2012 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා	-	10,064,170.00
එකතුව		**19,605,068.75**

- **රෝද 04 ට්‍රැක්ටර් වාරික මුදල්** (රු.)
- 1986-2012 දක්වා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබා දී ඇති ට්‍රැක්ටර් සඳහා - 534,700.00

- **වතුර පොම්ප වාරික මුදල්** (රු.)

- 2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කරන ලද වතුර පොම්ප සඳහා - 316,085.00

4.6.2 ගර්හිත ට්‍රැක්ටර් හා කෘෂි උපාංග අපහරණය.

2017 වර්ෂයේදී ගර්හිත ට්‍රැක්ටර් හා කෘෂි උපාංග අපහරණය යටතේ පහත පරිදි අපහරණ කටයුතු සිදු කර ඇත.

දිස්ත්‍රික්කය	රෝද 04 ට්‍රැක්ටර්	රෝද 02 ට්‍රැක්ටර්	ට්‍රේලර්	වෙනත්
ගම්පහ	26	01	23	91
කළුතර	03	02	04	03
එකතුව	**29**	**03**	**27**	**94**

4.7 වාර්ෂික ගිණුම් වාර්තා.

2016 වර්ෂයේ වාර්ෂික ගිණුම් වාර්තා 2017.12.31 දක්වා 520 ක් ලැබී ඇති අතර ඉතිරි හිඟ ගිණුම් වාර්තා සියල්ල ගෙන්වා ගැනීමට දිස්ත්‍රික් මට්ටමින් ලිපි යවා ඇත.

ගිණුම්කරණය පිළිබඳ නිළධාරීන්ට විධිමත් පුහුණුවක් නොලැබීම සහ කමිටු ලිපිකරු නිළධාරී හිඟය හේතුවෙන් පසුගිය වර්ෂයේ ගිණුම් වාර්තා සැකසීම ප්‍රමාද වී ඇති අතර ගිණුම් පුහුණුව ලබාදීමෙන් අනතුරුව මේ වන විට මෙම ගිණුම් වාර්තාව සකස් කරමින් පවතී. ඒ අනුව මේ වන විට ගො.සේ.ම 526 ක් සකස්කොට අවසන් කර ඇත. විධිමත් පුහුණුවක් ලබා දී නිලධාරී පුරප්පාඩු පිරවීම තුළින් 2018 වර්ෂයට අදාළ ගිණුම් වාර්තා නියමිත කාලය තුළ සකස් කර අවසන් කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කොට ඇත.

4.7.1 2006 වර්ෂයේ සිට 2017.12.31 දින දක්වා වාර්ෂික ගිණුම් වාර්තා ලැබීමේ ප්‍රගතිය

අනු අංකය	දිස්ත්‍රික්කය	2017 වර්ෂයේදී පවතින මධ්‍යස්ථාන සංඛ්‍යාව	වර්ෂයන්											
			2006	2007	2008	2009	2010	2011	2012	2013	2014	2015	2016	2017
1	කොළඹ	9	7	7	8	8	8	9	9	9	9	9	9	8
2	ගම්පහ	26	26	26	26	26	26	26	26	26	26	26	26	26
3	කළුතර	20	20	20	20	20	20	20	20	20	20	20	20	20
4	මහනුවර	45	45	45	45	45	45	45	44	42	41	41	38	39
5	මාතලේ	23	23	23	23	23	23	23	23	23	23	22	23	21
6	නුවරඑළිය	22	22	22	22	22	22	22	22	22	22	22	22	22
7	ගාල්ල	33	33	33	33	33	33	33	32	33	31	31	30	28
8	මාතර	22	22	22	22	22	22	22	21	21	21	22	22	22
9	හම්බන්තොට	17	16	16	16	16	16	16	16	17	17	17	17	17
10	යාපනය	15	13	15	15	15	15	15	15	15	15	15	15	15
11	කිලිනොච්චි	8	0	0	0	2	8	8	8	8	8	8	8	8
12	මන්නාරම	12	4	4	3	5	10	10	12	12	12	12	12	12
13	වව්නියාව	8	8	8	8	8	8	8	8	8	8	8	8	8
14	මුලතිව්	10	0	0	0	4	7	10	10	10	10	10	10	10

15	මඩකලපුව	17	17	17	17	17	17	17	17	17	17	17	17	17
16	අම්පාර	29	28	27	27	28	27	26	26	23	24	23	22	18
17	ත්‍රිකුණාමලය	22	22	22	22	22	22	22	22	22	22	22	22	22
18	කුරුණෑගල	56	55	55	55	55	54	55	55	55	56	56	55	56
19	පුත්තලම	18	18	18	18	18	18	18	18	18	18	18	18	18
20	අනුරාධපුර	42	35	38	40	40	40	41	41	41	40	40	38	41
21	පොළොන්නරුව	12	9	9	11	11	11	11	11	11	11	12	12	11
22	බදුල්ල	31	31	31	31	31	31	31	31	31	31	31	31	27
23	මොණරාගල	18	16	16	17	18	18	18	18	18	18	18	18	18
24	රත්නපුර	30	30	30	30	30	30	30	30	30	30	30	30	29
25	කෑගල්ල	14	14	14	14	14	14	14	14	14	14	13	14	14
මුළු එකතුව		**559**	**514**	**518**	**523**	**533**	**545**	**550**	**549**	**546**	**544**	**543**	**537**	**526**
මධ්‍යස්ථාන ගණන *(ගිණුම් වාර්තා ලැබිය යුතු)*			**549**	**551**	**553**	**554**	**554**	**555**	**558**	**558**	**559**	**559**	**559**	**559**
හිඟ ගිණුම් වාර්තා සංඛ්‍යාව			**35**	**33**	**30**	**21**	**9**	**5**	**9**	**12**	**15**	**16**	**22**	**33**

අනුරාධපුරය දිස්ත්‍රික්කයෙහි බුලනෑව ගොවිජන සේවා මධ්‍යස්ථානය හා පොලොන්නරුව දිස්ත්‍රික්කයෙහි අරලගංවිල ගොවිජන සේවා මධ්‍යස්ථානය මේ වන විට අකර්මන්‍යව පවතී.

05. ප්‍රවාහන අංශය.

2017 වර්ෂයේ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන වැඩ පනතේ නීතිමය කාර්යයන් සහ පරිපාලනය මඟින් පැවරෙන විවිධ නිල ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රවාහන අංශය මඟින් විශාල දායකත්වයක් ලබා දෙන ලදී. රාජකාරී සඳහා සැහැල්ලු වාහන (ජීප්, ද්විත්ව වෑන්, මෝටර් කාර්) ඇතුළුව ලොරි, ටෙන්වීල්, ප්‍රයිම් මූවර් රථ හා ක්‍රේන් ට්‍රක් රථ ඇතුළත්ව ධාවනයේ යෙදෙන වාහන 153 ක් පමණ වන දෙපාර්තමේන්තුව සතු වාහන ප්‍රවාහනයට යොදවා ගන්නා ලද අතර එම වාහන අතුරින් අවු. 20 අධික පැරණි වාහන අළුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු ඉටුකර ගනිමින් මෙම කාර්යයන් බාධාවකින් තොරව ඉටුකිරීමට පහසුකම් සැලසීම කරනු ඇත.

5.1. ප්‍රවාහන සංචිතයේ ප්‍රධාන කාර්යයන්.

1.ප්‍රධාන කාර්යාලයේ හා සියළුම දිස්ත්‍රික් කාර්යාල වල ඇති වාහනවල අළුත්වැඩියාවන්.
2. වාහන අනතුරු සම්බන්ධව මු.රෙ. අනුව නීතිමය කටයුතු කිරීම.
3. හානි හා පාඩු ලේඛන පවත්වා ගෙන යෑම.
4. විසර්ජන ගිණුම් පිළියෙල කිරීම.
5. ධාවන සටහන් ලේඛන පරීක්ෂාව හා විගණනයට ඉදිරිපත් කිරීම.
6. විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම.
7. වාහන රක්ෂණය.
8. නිදහස් ආදායම් බලපත්‍ර ලබා ගැනීම.
9. වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සෑදීම.
10. ඉන්ධන නිකුත් කිරීම, බිල්පත් පියවීම.
11. නව වාහන ලබා ගැනීම.
12. රියදුරු/ රිය සහායකයින්ගේ නිවාඩු සැකසීම හා අතිකාල ගමන් වියදම්පත් පරීක්ෂාව.
13. නිලධාරීන්ට වෙන්කල වාහන සඳහා මාසික ඉන්ධන ගාස්තු ගෙවීමට වවුචර් පිළියෙල කිරීම.
14. නිල වාහන සඳහා ලබා ගන්නා අතිරේක ඉන්ධන වෙනුවෙන් කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කිරීම.
15. ඉන්ධන අත්තිකාරම් ගෙවීම හා පියවීම ඉටුකිරීම.

5.2. 2017 වර්ෂය සඳහා ප්‍රවාහන අංශය මඟින් ඉටු කර ඇති කාර්යයන් සැකෙවින්.

1. නිලධාරීන්ගේ ප්‍රවාහන කටයුතු කොළඹ දිස්ත්‍රික්කය තුළ හා දිවයින පුරා නිලධාරීන් ප්‍රවාහනය සඳහා පොදු වාහන පහසුකම් සැලසීම.
2. වැව් ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා අධික බරෙන් යුතු බුල්ඩෝසර් සහ එස්කැවේටර් යන්ත්‍ර ප්‍රවාහනය.
3. කෘෂි උපකරණ බෙදා හැරීම සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම.
4. අලුත් සහල් මංගල්‍යය සඳහා ලොරි රථ හා අනෙකුත් ප්‍රවාහන පහසුකම් සැලසීම.

2017 වර්ෂය තුළ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ අත්පත් කර ගැනීමට නියමිත ඉලක්කයන් 90% ක් පමණ සපුරා ගැනීමට හැකිවිය.

06. නීති අංශය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම්වලින් ප්‍රශස්ත ඵලදායීතාවක් ලබා ගනිමින් ශ්‍රී ලාංකීය ගොවි ජනතාව තිරසාර සංවර්ධනයක් සඳහා රැගෙන යාමේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දර්ශනය මුදුන්පත් කරලීම සඳහා පහත සඳහන් ආකාරයෙන් නීති අංශය එම මෙහෙවරට දායක වේ.

- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සැකසීමට ගොවිජන නීතිය, ඊට අදාළ රීති සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය වෙත ලබා දීම හා සහාය වීම.

- අද ගොවීන් හා ඉඩම් හිමියන් අතර ඇතිවන කෘෂිකාර්මික ආරවුල් විසඳීම සඳහා වන නෛතික මඟපෙන්වීම.

- වගා අයිතිවාසිකම් ආරක්ෂා කර දීම.

- ග්‍රාමීය වාරි කර්මාන්ත ආරක්ෂා කිරීම හා වගා රීති ක්‍රියාත්මක කිරීමට අදාළ නීතිමය රැකවරණය සැලසීම.

- දෙපාර්තමේන්තු නිලධාරීන් හා ගොවීන් ආයතන සඳහා නීතිමය උපදේශනය.

- ගොවිජන නීතිය බලගැන්වීම සඳහා අධිකරණමය කාර්යයන්හි නිරත වීම.

6.1 2011 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත.

2000 අංක 46 දරණ පනතට 2011 අංක 46 දරණ සංශෝධිත පනත ගෙන ආ අතර එය 2011.11.22 දින සිට ක්‍රියාත්මක වන බැවින් ඒ අනුව අද ගොවි අනුප්‍රාප්තිය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. එමඟින් 2000.08.18 දින හෝ ඊට පෙර දිනවල ලිඛිත හෝ වාචික ගිවිසුමක් මත අද ගොවි අයිතිවාසිකම් හිමි අයකු මිය ගිය අවස්ථාවකදී අඳ අයිතිය උරුම විය යුතු බව සහ අඳ ගොවියා පූර්ණ දුබලතාවයකට පත් වූ විට අඳ ගොවි අනුප්‍රාප්තිය පැවරීම සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

දැනට ක්‍රියාත්මක වන 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත හා 2011 අංක 46 දරණ (සංශෝධන) පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නියෝග සාදා මේ වනවිට ක්‍රියාත්මක වන අතර කාලීනව ඉතාමත් වැදගත් වන කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව වගා කිරීම සඳහා වන පනතේ 22,23,25 සහ 26 වගන්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නියෝග සාදා දැනටමත් වගා නොකර පුරන්ව පැවති කුඹුරු ඉඩම් විශාල ප්‍රමාණයක් වගා කෙරෙමින් පවතී. එසේම ගොවිජන සංවර්ධන පනතේ ඉතිරි නියෝග තෙත්‍රෙ භාෂාවෙන් සකස් කර මේ වනවිට නීති කෙටුම්පත් සම්පාදක වෙත යවා ඇත.

6.2 ගොවි ආරවුල් විසඳීම. (ගොවිජන විනිශ්චය සභා / සමාලෝචන මණ්ඩල).

2011 අංක 46 දරණ පනතින් සංශෝධිත 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත අනුව ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන් නෙරපීම, අඳ ගොවීන් විසින් ඉඩම් හිමියන් වෙත ප්‍රවේණි ගෙවීම පැහැර හැරීම ඇතුළු පනතේ සඳහන් වගන්ති 11 ක් සම්බන්ධයෙන් ගොවිජන විනිශ්චය සභාව මඟින් පරීක්ෂණ පැවැත්විය යුතු ලෙස දක්වා ඇති අතර ගොවිජන විනිශ්චය සභා වල තීරණයට එරෙහිව අභියාචනා කිරීම සඳහා පිහිටුවා ඇති සමාලෝචන මණ්ඩල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නියෝග සාදා ඒ අනුව ගොවිජන විනිශ්චය සභා සහ සමාලෝචන මණ්ඩල මේ වනවිට ක්‍රියාත්මක වෙමින් පවතී.

6.2.1 ගොවිජන විනිශ්චය සභා සඳහා ලැබී ඇති පැමිණිලි.

විනිශ්චය සභා සඳහා ලැබී ඇති පැමිණිලි ගණන	යොමුකර ඇති කැඳවීම් ලිපි ප්‍රමාණය	පවත්වා ඇති පරීක්ෂණ ගණන	පවත්වා අවසන් පරීක්ෂණ ගණන	**2017. 12.31** දිනට ඉතිරි පරීක්ෂණ ගණන
5532	3158	2656	1770	3762

6.2.2 2017.12.31 දිනට සමාලෝචන මණ්ඩයේ ප්‍රගතිය.

අභියාචනා ගොනු ගණන	විභාග කිරීම සඳහා ඉදිරිපත්කර ඇති ගොනු ගණන	නියෝග නිකුත්කර ඇති නඩු	ඉල්ලා අස්කර ගැනීමට ඉල්ලීම් කළ නඩු	ඉදිරි කටයුතු සඳහා පවතින නඩු
397	95	69	06	227

6.2.3 ගොවි පැමිණිලි (පොදු)

ගොවිජන සංවර්ධන පනත යටතේ ලැබී ඇති පැමිණිලි.

2017 වර්ෂය තුළ ලැබීම්	**2016.12.31** .දිනට නොවිසඳුනු පැමිණිලි	**2017** වර්ෂය තුළ විසඳීම්	**2017 12.31.**දිනට ඉතිරි
9150	10753	6095	13808

6.3 අධිකරණ කටයුතුවලට මැදිහත්වීම්.

නීතිපති සහාය ලබා ගැනීමට කටයුතු කිරීම.

- ශ්‍රේෂ්ඨාධිකරණය - **04**
- අභියාචනාධිකරණය - **09**
- දිසා අධිකරණය - **10**
- මහාධිකරණය - **30**
- මහේස්ත්‍රාත් අධිකරණය - **47**

එකතුව - 100

කුඹුරු ඉඩම් අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමෙන් නීතිමය පියවර ගැනීම 2017 වර්ෂය තුළ ප්‍රගතිය පහත දැක් වේ.

1. අනවසර ගොඩ කිරීම් /ඉදිකිරීම් සඳහා තහනම් නියෝග ලබා ගත් සංඛ්‍යාව (33 වගන්තිය) - **144**

2. වරදට දඬුවම් කිරීම හා යථා තත්ත්වයට පත් කිරීම - (32 වගන්තිය) **– 135**

3. අවසන් වූ නඩු සංඛ්‍යාව - **28**

6.4 කෘෂිකාර්මික ඉඩම් ලේඛන සම්බන්ධ කාර්යයන්:

ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීමේ දී උක්ත පනතේ 53 වගන්තිය කෘෂිකාර්මික ඉඩම් ලේඛන සම්බන්ධයෙන් පනවා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම වැදගත් කාර්යයකි. දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථානවල ඇති කෘෂිකර්ම ඉඩම් ලේඛන (ගොඩ/මඩ) මහජන පරීක්ෂාව සඳහා සෑම වර්ෂයකටම දෙවරක් එනම් ජනවාරි හා ජූලි මාස වල විවෘතව තබන බව පුවත්පත් මඟින් දැනුම් දෙනු ලැබේ. එසේ විවෘතව තැබීමෙන් අනතුරුව ඒ පිළිබඳව ලැබෙන ඉල්ලුම්පත් පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ගොවිජන සේවා කාරක සභාවල වගකීමකි. උක්ත ක්‍රියාවලියේ ප්‍රගතිය පහත ඉදිරිපත් කර ඇත.

6.4.1 කෘෂිකාර්මික ඉඩම් ලේඛන සංශෝධනය.

2017 වර්ෂය තුළ ලැබීම්	**පෙර වර්ෂ වල ඉතිරි**	**පරීක්ෂණ කළ යුතු මුළු ගණන**	**පරීක්ෂා කර අවසන්**	**ඉතිරි සංඛ්‍යාව**
8524	8074	16598	3648	12950

6.5 නෛතික උපදේශන කාර්යයන්.

දෙපාර්තමේන්තු නිලධාරීන් වගඋත්තරකරුවන් කරමින් අධිකරණයේ පවරනු ලබන නඩු සම්බන්ධයෙන් නීතිපති සහාය ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී අධිකරණයේ පෙනී සිටීම සිදු

කරනු ලැබේ. යම් යම් හේතූන් මත මානව හිමිකම් කොමිෂම මඟින් සහනයක් අපේක්ෂා කරන්නන් සඳහා අවශ්‍ය සහාය ලබාදීම සහ පෙනී සිටීම සිදු කෙරේ.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත, මානව හිමිකම් කොමිෂම වෙත අවශ්‍ය අවස්ථාවන්හි දී පෙනී සිටීමින් කරුණු ඉදිරිපත් කිරීම සිදුකරනු ලැබේ. එහි විස්තර පහත දැක් වේ.

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් වූ පැමිණිලි	03
මානව හිමිකම් කොමිෂමට ඉදිරිපත් වූ පැමිණිලි	02
පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට පිලිතුරු සැපයීම	01
සිවිල් නඩු විධාන සංග්‍රහය (461 වගන්තිය)	02
අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාවට ඉදිරිපත් වූ පැමිණිලි	04

07. ගිණුම් අංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි ගිණුම් අංශය ප්‍රධාන අංශ 4 කින් සමන්විත වේ. මුදල් අංශය, ගෙවීම් හා සාරාංශ අංශය, වැටුප් හා අත්තිකාරම් ගිණුම් අංශය හා ප්‍රසම්පාදන අංශය මෙම අංශ හතර වේ. මුදල් අංශය, වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කිරීම, අක්මුදල් අවශ්‍යතා ලබා ගැනීම, භාණ්ඩාගාරය සමඟ අදාළ සම්බන්ධීකරණයන් ඉටු කිරීම හා වාර්ෂික විසර්ජන ගිණුම පිළියෙල කිරීමට අදාළ කාර්යයන් ඉටු කරයි. ගෙවීම් හා සාරාංශ අංශය දෙපාර්තමේන්තුවේ සියලු ගෙවීම් කටයුතු සිදු කිරීම, දිස්ත්‍රික් කාර්යාල 25 හි ගෙවීම් කටයුතු අධීක්ෂණය , මාසික ගිණුම් සාරාංශ ඒකාබද්ධ කර භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම හා පොදු තැන්පත් ගිණුම් වල කටයුතු සිදු කරයි. වැටුප් හා අත්තිකාරම් ගිණුම් අංශයෙන් ප්‍රධාන කාර්යාලයේ වැටුප් හා අත්තිකාරම් ගෙවීම් හා දිස්ත්‍රික් කාර්යාල 25 ට අදාළ වැටුප් හා අත්තිකාරම් ගෙවීම් කටයුතු අධීක්ෂණය කිරීම හා වාර්තා පවත්වා ගැනීම සිදුකරයි. ප්‍රසම්පාදන අංශය ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන හා ගබඩා කටයුතු මෙන්ම දිස්ත්‍රික් කාර්යාල 25 ට අදාළ ප්‍රසම්පාදන හා ගබඩා කටයුතු පාලනය හා අධීක්ෂණ කාර්යයන් ඉටු කරයි.

7.1 කාර්යභාරය.

1. වාර්ෂික විසර්ජන පනතින් බලය ලැබූ වියදම් කළමනාකරණය කිරීම සඳහා මුදල් රෙගුලාසි, අණපනත්, චක්‍රලේඛන වලට අනුකූලව කටයුතු කරමින් දෛනිකව, මාසික හා වාර්ෂික ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වා ගැනීම.

2. වාර්ෂික වියදම් හා ආදායම් ඇස්තමේන්තු සැකසීම.

3. වත්කම් කළමනාකරණය.

4. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වල වැටුප් ණය අත්තිකාරම් , පොදු තැන්පත් ඇතුළු වියදම් මූලධන හා පුනරාවර්තන ගෙවීම් කටයුතු ඉටු කිරීම් හා වියදම් කළමනාකරණය කිරීම.

5. දෙපාර්තමේන්තුවේ හා දිස්ත්‍රික් කාර්යාලවල ප්‍රසම්පාදන කමිටු පත්කිරීම හා ප්‍රසම්පාදන කාර්යයන් ඉටු කිරීම හා අධීක්ෂණය.

6. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙන් ණය ගෙවීම් ඒවා නිසි පරිදි අයකර ගැනීම් හා ඊට අදාළ වාර්තා හා ගිණුම් පවත්වා ගැනීම.

7. දෙපාර්තමේන්තුවෙහි මාසික හා වාර්ෂික ගිණුම් පිළියෙල කිරීම හා නියමිත වේලාවට අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

8. දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් රාජ්‍ය ගිණුම් කාරක සභාවට ඉදිරිපත් කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම හා ඊට අදාළ කාර්යයන් ඉටු කිරීම.

9. ගොවිජන සංවර්ධන අරමුදලට අදාළව වාර්ෂික අයවැය ඇස්තමේන්තු පිළියෙල කිරීම, ලැබීම් හා ගෙවීම් කළමනාකරණය කිරීම හා අවසාන ගිණුම් පිළියෙල කිරීම .

10. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් නමින් ලැබෙන සියලුම විගණන වීමසුම් සඳහා පිළිතුරු සැපයීම.

7.2 වර්ෂයේ කාර්යසාධනය

මෙම වර්ෂයේ මෙහෙයුම් වැඩසටහන හා සංවර්ධන වැඩසටහන යන වැඩසටහන් දෙක වෙනුවෙන් දෙපාර්තමේන්තුව වෙත රු. මි. 8,623.85 ක සමස්ත ප්‍රතිපාදනයක් මහා භාණ්ඩාගාරයෙන් වෙන්කර තිබුණි. මෙයින් රු. මි. 6,752.17 ක් පුනරාවර්ථන වැය සඳහා වූ අතර රු. මි. 1,881.68 ක් මූලධන ව්‍යාපෘතීන් සඳහා විය. පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනයන් වර්ෂය තුළදී උපයෝජනය වූ ආකාරය පහත අයුරු වේ.

විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය රු. මි. ලි	වාර්ෂික වියදම රු. මි. ලි	ප්‍රතිපාදන ඉතිරිය රු. මි.	ශුද්ධ ප්‍රතිපාදනයට සාපේක්ෂව වාර්ෂික වියදම % ලෙස
පුනරාවර්තන	**6,752.17**	**6,676.10**	**244.30**	**96.47**
1-1 මෙහෙයුම් ක්‍රියාකාරකම්	**463.07**	**444.28**	**18.80**	**95.94**
පුද්ගල පඩිනඩි	406.31	390.74	15.58	96.16
වෙනත්	56.75	53.54	3.22	94.32
2-2 සංවර්ධන ක්‍රියාකාරකම්	**6,289.10**	**6,254.58**	**24.52**	**99.60**
පුද්ගල පඩිනඩි	6020.76	6,020.11	0.64	99.98
වෙනත්	268.34	234.47	23.88	90.75
මූලධන	**1,881.69**	**914.22**	**967.45**	**48.58**

1-1 මෙහෙයුම් ක්‍රියාකාරකම්	**57.52**	**31.08**	**26.44**	**54.02**
ගොඩනැගිලි පුනරුත්ථාපන	35.58	20.40	15.17	57.35
වාහන පුනරුත්ථාපන	17.94	7.12	10.81	39.70
ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ	2.00	1.80	0.20	90.12
පුහුණු හා හැකියා වර්ධන	2.00	1.76	0.25	87.94
2-2 සංවර්ධන ක්‍රියාකාරකම්	**1,824.17**	**837.95**	**986.26**	**45.93**
ගොඩනැගිලි පුනරුත්ථාපන	137.40	71.35	66.04	51.93
යන්ත්‍ර පුනරුත්ථාපන	7.00	6.57	0.43	93.82
වාහන පුනරුත්ථාපන	5.00	3.65	1.34	73.07
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	20.00	16.35	3.65	81.74
යන්ත්‍ර අත්පත් කර ගැනීම්	2.00	1.28	0.73	63.75
ගොඩනැගිලි ඉදිකිරීම්	63.23	29.60	33.62	46.81
පොහොර ගබඩා ඉදිකිරීම්	30.54	30.22	0.31	98.98
පුරන් කුඹුරු අස්වැද්දීම	71.20	15.94	15.27	22.39
සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය	1,487.80	662.99	824.80	44.56

2017 වර්ෂයේදී මූලධන වියදම් සඳහා දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ වෙන් කරන ලද රු. මි. 1,881.67 ට අමතරව කෘෂිකර්ම අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු. මි. 4,600.90 ක් ද, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ රු. මි. 314.51 ක් ද, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ රු. මි. 54.00 ක් ද ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපාදන යටතේ රු. මි. 2.08 ක් ද, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තු ප්‍රතිපාදන යටතේ රු. මි. 1.69 ක් ද ලෙස රු. මි. 4,971.1 ක් ලැබුණු අතර ඒ අනුව 2017 වර්ෂයේ ගොවිජන සංවර්ධන

දෙපාර්තමේන්තුව වෙත රු. මී. 6,854.85 ක මූලධන ප්‍රතිපාදන දිවයිනේ දිස්ත්‍රික් කාර්යාල 25 ම දායක කර ගනිමින් රටේ සංවර්ධන කාර්ය සඳහා උපයෝජනය කරන ලදී.

2017 වර්ෂයේ දී දෙපාර්තමේන්තු ප්‍රාග්ධන වැය විෂයන්ගේ මූල්‍ය ප්‍රගතිය 48.58% ක් විය. මෙයට හේතු වූයේ වර්ෂය අවසානයේ ගෙවීම් කිරීම සඳහා ප්‍රමාණවත් තරමින් අක්මුදල් නොලැබීමය.

ගිණුම් අංශයේ කාර්ය මණ්ඩලය මනාව මෙහෙයවමින් අදාළ ප්‍රතිපාදන දිස්ත්‍රික් කාර්යාල අතර බෙදාහැර දිවයින පුරාම කාර්යාල වල මූල්‍ය කළමනාකරණය සාර්ථකව ඉටුකිරීමට හැකිවීම මෙම වසරේ අප ලද ජයග්‍රහණය වේ.

7.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් අංක 281011/281012

	වියදමෙහි උපරිම සීමාව (රු.)	ලැබීම් වල අවම සීමාව (රු.)	හර ශේෂයෙහි උපරිම සීමාව (රු.)
විසර්ජන පනතින් බලය දුන් සීමාව	285,000,000.00	225,000,000.00	600,000,000.00
වර්ෂයේ සත්‍ය අගයන්	284,190,210.67	234,464,982.41	407,066,034.93

2017 වර්ෂය තුළදී උත්සව අත්තිකාරම් ලෙස රු. මී. 110.17 ක් ද, විශේෂ අත්තිකාරම් ලෙස රු. මී. 36.4 ක් ද, ආපදා ණය ලෙස රු. මී. 90.40 ක් හා ගංවතුර හානි සඳහා ණය ලෙස රු. මී. 47.22 නිලධාරීන් අතරේ ලබාදීම සිදු කෙරිණ.

08. අභ්‍යන්තර විගණන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව ප්‍රධාන අභ්‍යන්තර විගණක හා නිලධාරීන් 32 දෙනෙකු 2017 වර්ෂයේ සේවයේ යෙදී ඇත. දිස්ත්‍රික්ක 19 ක් ආවරණය වන පරිදි ගොවිජන සේවා කාරක සභා, මධ්‍යස්ථාන අවසන් ගිණුම් හා ගොවි බැංකු නියමු ව්‍යාපෘති ද ඇතුළුව අභ්‍යන්තර විගණන 195 ක් සිදුකර ඇත. විස්තර පහත පරිදි වේ.

අනු අංකය	විගණන සැලැස්ම අනුව විගණන ක්ෂේත්‍ර	විගණන සැලැස්ම අනුව සංඛ්‍යාව	සිදුකරන ලද විගණන සංඛ්‍යාව
1	ප්‍රධාන කාර්යාලයේ ආයතනික කටයුතු	03	02
2	ප්‍රසම්පාදන	04	0
3	ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලවල පරිපාලන කටයුතු	03	04
4	ඉදිකිරීම් හා අළුත්වැඩියා (ව්‍යාපෘති)	07	08
5	ගොවිජන සේවා මධ්‍යස්ථානවල මුදල් ගනුදෙනු හා ගිණුම්	156	74
6	ගොවි බැංකු නියමු ව්‍යාපෘතියේ ගනුදෙනු	72	28
7	ගොවිජන සංවර්ධන අරමුදලේ ලැබීම් හා ගෙවීම්	01	-
8	විශේෂ පරීක්ෂණ	අවස්ථානෝචිත පරිදි	10
9	විගණන කළමනාකරණ කමිටු රැස්වීම්	04	03
10	මධ්‍යස්ථාන අවසන් ගිණුම් පරීක්ෂාව	08	65
11	කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යෙදවීම	02	01
	එකතුව	**260**	**195**

8.1 දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද අභ්‍යන්තර විගණන හා විශේෂ පරීක්ෂණ පහත පරිදි වේ.

අනු අංකය	දිස්ත්‍රික්කය	සිදුකරන ලද විගණන ගණන		සිදුකරන ලද විශේෂ පරීක්ෂණ	එකතුව
		මධ්‍යස්ථාන කමිටු	ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය		
1	කොළඹ	03	02	01	**06**
2	ගම්පහ	06	01	01	**08**
3	කළුතර	04	02	0	**06**
4	ගාල්ල	01	0	0	**01**

5	මාතර	04	02	0	**06**
6	හම්බන්තොට	02	0	01	**03**
7	රත්නපුර	01	01	0	**02**
8	කෑගල්ල	0	02	0	**02**
9	කුරුණෑගල	12	05	04	**21**
10	පුත්තලම	01	02	01	**04**
11	මහනුවර	05	0	01	**06**
12	නුවරඑලිය	06	04	0	**10**
13	බදුල්ල	10	01	0	**11**
14	මොණරාගල	05	02	0	**07**
15	අනුරාධපුරය	05	02	0	**07**
16	පොළොන්නරුව	02	0	0	**02**
17	මාතලේ	01	01	0	**02**
18	අම්පාර	02	01	01	**04**
19	ත්‍රිකුණාමලය	04	0	0	**04**
20	ප්‍රධාන කාර්යාලයේ ආයතනික කටයුතු	-	-	-	**02**
21	මධ්‍යස්ථාන අවසන් ගිණුම්	-	-	-	**65**
22	කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යෙදවීම	-	-	-	**01**
23	විගණන කළමනාකරණ කමිටු රැස්වීම්	-	-	-	**03**
24	ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාල	-	-	-	**04**
25	ඉදිකිරීම් හා අළුත් වැඩියා කටයුතු	-	-	-	**08**
	එකතුව	**74**	**28**	**10**	**195**

09. එලදා වර්ධන හා අලෙවි අංශය.

“ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ සහ සියලු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර සංවර්ධනය” යන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැක්ම ලඟා කරගනු පිණිස එලදා වර්ධන හා අලෙවි අංශයට පැවරී ඇත්තේ මහත් වූ කාර්ය භාරයකි.

ඒ අනුව ශ්‍රී ලංකාව තුළ වූ කෘෂිකාර්මික ඉඩම් තුළින් උපරිම කෘෂිකාර්මික ඵලදාවක් ලඟා කර ගනු පිණිස 2017 වසරේදී පහත කාර්යයන් ඉටු කරන්නට යෙදිණි.

9.1. 15/2012 චක්‍රලේඛය.

2012 වර්ෂයේදී හඳුන්වා දුන් 15/2012 චක්‍රලේඛය ප්‍රකාරව පුරන් වූ කුඹුරු ඉඩම් තුළ කෙටි කාලීන බෝග වගාව සහ මිරිදිය මත්ස්‍ය වගාව වැඩි වශයෙන් ප්‍රවලිත කිරීමට කටයුතු කළ අතර ඒ සඳහා දිස්ත්‍රික් භාර නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් ද නිරන්තරයෙන් උනන්දු කරවූ අතර දිස්ත්‍රික් මට්ටමින් විශේෂ දැනුවත් කිරීම් සහිතව වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි.

9.2. 4/2009 චක්‍රලේඛය.

4/2009 චක්‍රලේඛය පදනම් කරගනිමින් කාර්යක්ෂමව කුඹුරු ඉඩම් වගාව සඳහා අවසර ලබා දීමටත් කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව වැඩි කර ගැනීම අරමුණු කරගනිමින් කෘෂි මාර්ග සකස් කර ගැනීමට කරන ලද ඉල්ලීම් සඳහා අවශ්‍ය අනුමැතිය කඩිනමින් ලබා දීමටත් 2017 වසරේදී කටයුතු කරන ලදී.

10. ගොවිජන බැංකු අංශය.

ගොවිජන බැංකුවේ දැක්ම

" ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර සංවර්ධනය සහතික කෙරෙන මූල්‍ය සංස්කෘතියක් "

ගොවිජන බැංකුවේ මෙහෙවර

" ස්වශක්තියෙන් හෙබි අභිමානවත් ගොවිජන සමාජයක් ගොඩනැඟීමට අවශ්‍ය කෙරෙන මූල්‍ය ශක්තිය එම සමාජය තුළ ස්ථාපිත කිරීම සඳහා ගොවි ජනතාව සංවිධානය කිරීම, සවිබල ගැන්වීම, ආයතනික ව්‍යුහයන් සංවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම."

10.1 ගොවිජන බැංකුවේ අභිමතාර්ථ

1. ග්‍රාමීය ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය මූල ධනය සපයා ගැනීමට සහාය වන ආයතනයක් ලෙස කටයුතු කිරීම.
2. ගොවි ජනතාවගේ ඉතිරි කිරීම් නැමියාව වර්ධනය කර ගැනීම හා ඒ තුළින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීමට සහාය වීම.
3. යැපුම් මට්ටමේ කෘෂිකර්මාන්තය වාණිජමය මට්ටමකට පත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහ උපදේශාත්මක පහසුකම් සලසා දීම.
4. ගොවි ජනතාව සංවිධාන ගතකර ඔවුන්ගේ මූල්‍ය හා ආර්ථික ශක්තිය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීම.
5. ගොවි ජනතාව සමාජීය වශයෙන් බලවත් සමාජ ස්ථරයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය කෙරෙන මූල්‍ය පරිසරය ගොඩනැඟීම සහ ඔවුන්ගේ සුභසාධන කටයුතු සඳහා දායක වීම.
6. ගොවි ජනතාව සතු මුදල් සහ ප්‍රාග්ධනය එම ජනතාව අතරම සංසරණය වීමට අවකාශ සැලසීම මඟින් ගොවි ආර්ථිකය ප්‍රසාරණය කිරීම.
7. ගොවි සංවිධාන ශක්තිමත් කර කෘෂි කර්මාන්තය පාදක කර ගත් ව්‍යාපාර සඳහා ඔවුන්ට අවශ්‍ය මූල්‍ය ශක්තිය ලබාදීම.
8. ලොකු ළූණු, මුං, සෝයා ආදී දැනට විශාල වශයෙන් ආනයනය කරන බෝග වගාවන් සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම තුළින් එම වගාවන් බහුල කිරීම හා එමඟින් ජාතික ආර්ථිකයට ශක්තියක් සැපයීම.

10.2 2017.12.31 දිනට දිස්ත්‍රික් මට්ටමින් පිහිටුවා ඇති ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘති සංඛ්‍යාව.

අනු අංකය	දිස්ත්‍රික්කය	ගොවිජන සේවා මධ්‍යස්ථාන ගණන	පිහිටුවා ඇති ගොවිජන බැංකු ගණන
01	කොළඹ	9	9
02	ගම්පහ	26	26
03	කළුතර	20	19

04	මහනුවර	45	45
05	මාතලේ	23	23
06	නුවරඑළිය	22	22
07	ගාල්ල	33	33
08	මාතර	22	22
09	හම්බන්තොට	17	17
10	කුරුණෑගල	56	56
11	පුත්තලම	18	18
12	අනුරාධපුරය	43	42
13	පොළොන්නරුව	13	12
14	බදුල්ල	31	31
15	මොණරාගල	18	18
16	රත්නපුරය	30	30
17	කෑගල්ල	14	14
18	අම්පාර	29	29
19	ත්‍රිකුණාමලය	22	18
20	මඩකලපුව	17	16
21	වව්නියාව	8	8
22	යාපනය	15	15
23	මන්නාරම	12	12
24	මුලතිව්	10	10
25	කිලිනොච්චිය	8	6
එකතුව		**561**	**551**

අනුරාධපුරය දිස්ත්‍රික්කයෙහි බුලනෑව ගොවිජන සේවා මධ්‍යස්ථානය හා පොලොන්නරුව දිස්ත්‍රික්කයෙහි අරලගංවිල ගොවිජන සේවා මධ්‍යස්ථානය මේ වන විට අකර්මන්‍යව පවතී.

10.3 2017.12.31 දිනට ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතිය සමඟ සම්බන්ධ වී සිටින ගොවීන් පිළිබඳ විස්තර හා 2016 වර්ෂයට සාපේක්ෂව වර්ධනය.

	2017.13.31දිනට	2016.12.31දිනට	වර්ධන ප්‍රතිශතය %
කොටස්කරුවන් සංඛ්‍යාව	859,394	772,496	11.24 %
තැන්පත්කරුවන් සංඛ්‍යාව	725,007	610,380	18.77 %
කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාව	55,877	46,956	19 %

10.4 2017.12.31 දිනට ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘතියේ මූල්‍ය තොරතුරු.

විස්තරය	2016.12.31 දිනට (රු.)	2017.12.31දිනට (රු.)
වාර්ෂික ශුද්ධ පොලී ආදායම	90,170,167.00	80,754,516.00
ඉතිරි කිරීම් ගිණුම් හා ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය	645,699,015.00	756,424,902.00
ජංගම ගිණුමේ ශේෂය	27,465,512.00	58,723,861.00
ණය ගැතියෝ	1,339,574,934.00	1,428,462,224.00
ගොවීන්ගේ කොටස් මුදල් පාලන ගිණුම	387,863,871.00	450,585,389.00
ප්‍රාග්ධන ගිණුම	194,204,346.00	194,794,298.00
ගොවීන්ගේ ඉතිරි කිරීම් පාලන ගිණුම	598,546,000.00	706,295,230.00
ගොවීන්ගේ කණ්ඩායම් පාලන ගිණුම	132,662,235.00	157,165,303.00

10.5 ගොවිජන බැංකුව වෙත ප්‍රාග්ධන මුදල් නිකුත් කිරීම.

2017 වර්ෂය තුළ ගොවීන්ගේ භාරකාර අරමුදල වෙතින් ගොවිජන බැංකු වෙත ප්‍රාග්ධනය ලබාදීම සඳහා රු. 20,000,000/- ක මුදලක් ණය ලබාගෙන ඇති අතර, රු. 23,250,000/- ක මුදලක් ගොවිජන බැංකු වෙත ප්‍රාග්ධන ලෙස නිකුත් කර ඇත. පෙර වර්ෂ වලදී ලබා ගත් කල්පිරුන ලද රු.48,800,000/- ක මුදල ආපසු ගොවීන්ගේ භාරකාර අරමුදල වෙත පියවා ඇත.

10.6 ගොවිජන බැංකු මඟින් ණය නිකුත් කිරීම් හා අයවීම්.

ගොවිජන බැංකු මඟින් ආරම්භයේ සිට 2017.12.31 දින දක්වා නිකුත් කර ඇති මුළු ණයවල වටිනාකම රු.9,609,788,581/- ක් වන අතර, මුළු ණය අය කර ගැනීම් වල වටිනාකම රු.8,166,729,039/- කි. ඒ අනුව අයවිය යුතු මුදල රු.1,443,059,541/- ක් වේ. මෙයින් රු. 1,120,653,120/- ක් කල් පසු නොවූ ණය මුදල් වන අතර රු. 322,406,421/- ක් කල් පසු වූ ණය වේ.

මේ අනුව සමස්ත ණය වටිනාකමින් කල් පසු වූ ණය ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස 3.35% ක් පමණි. 2017 වර්ෂයේදී ගොවිජන බැංකු මඟින් කෘෂිකාර්මික ණය රු.525,063,582/- ක් ද, ව්‍යාපෘති ණය රු.570,958,917/- ක් ද, අනෙකුත් ණය රු. 30,085,872/-ක් ද, ලෙස රු. 1,126,108,371/- ක ණය මුදලක් ගොවීන් වෙත නිකුත් කර ඇත.

11. ජල කළමනාකරණ අංශය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජල කළමනාකරණ අංශය 1981 වර්ෂයේ ආරම්භ කරන ලද අතර, වර්තමානයේ එය ජල කළමනාකරණය පිළිබඳ ඉංජිනේරුවරයකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ.

දැනට තිබෙන මානව සම්පත්	ජල කළමනාකරණ අංශය	දුරස්ථ ගෝචර අංශය
• ඉංජිනේරු	01	-
• ඉංජිනේරු සහකාර	01	01
• කාර්මික නිලධාරී	-	01
• සංවර්ධන නිලධාරී	-	03
• රාජ්‍ය කළමනාකරණ සහකාර	02	-
• කම්ටු ලිපිකරු	01	
• කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර	-	01
• කාර්යාල කාර්ය සහායක	01	
• මුරකරු	01	

11.1. ජල කළමනාකරණ අංශයේ මෙහෙවර.

2000 අංක 56 දරණ ගොවිජන සංවර්ධන පනතේ 7 වන කොටස "වාරිමාර්ග වැඩ සහ වාරිමාර්ග ජල කළමනාකරණය" යන මාතෘකාව යටතේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති වගකීම් මෙන්ම 2014-12-22 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 1899/3 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ ශ්‍රී ලංකාවේ ජල මූලාශ්‍ර පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය දෙපාර්තමේන්තු මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සියලුම සුළු (ග්‍රාමීය) වාරිමාර්ග වල ඵලදායීතාවය ඉහල නැංවීම සහ ඒවා විධිමත් ලෙස කළමනාකරණය කිරීම මඟින් එහි ආරක්ෂාව සහ සංරක්ෂණය තහවුරු කිරීමට අවශ්‍ය වැඩ සටහන් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම ජල කළමනාකරණ අංශයේ මෙහෙවර වේ. ඒ අනුව 2017 වර්ෂයේ ඉටු කොට ඇති වගකීම් පහතින් දැක්වේ.

11.2. තත්ත්ව පාලනය .

ගොඩනැගිලි හා සුළු වාරිමාර්ග ඉදිකිරීම් වල තත්ත්ව පාලන හා අත්තිවාරම් නිර්මාණ වාර්තා ලබා දීම.

11.3. නව තත්ත්ව පාලනාගාර ස්ථාපිත කිරීම.

දිස්ත්‍රික් මට්ටමින් ගොඩනැගිලි හා සුළු වාරිමාර්ග ඉදිකිරීම් වල තත්ත්ව පාලන වාර්තා ලබා දීම සඳහා 2017 වර්ෂයේ නව තත්ත්ව පාලනාගාර 03 ක් අනුරාධපුර, පුත්තලම හා යාපනය යන දිස්ත්‍රික්ක වල ස්ථාපිත කරන ලදී.

11.4 ජලයේ ගුණාත්මය පරීක්ෂා කිරීම.

වාරි ජලයේ ගුණාත්මය මැනීම සඳහා Ec/pH මීටර් හා උපාංග කට්ටල 80 ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදීම.

11.5 පොතුහැර පුහුණු මධ්‍යස්ථානය වැඩි දියුණු කිරීම.

මේ යටතේ පොතුහැර පුහුණු මධ්‍යස්ථානයේ දේශන ශාලාව නවීකරණය කිරීම හා නව පරිගණක කාමරයක් ඉදිකිරීම සිදු කරන ලදී.

11.6 ජල කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

අංක 11/2017 චක්‍රලේඛය යටතේ ජාතික ආහාර නිෂ්පාදන සංග්‍රාමයට සමගාමීව දීප ව්‍යාප්ත සුළු වාරිමාර්ග නඩත්තු කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම හා වාරිමාර්ග වල සුළු අළුත්වැඩියාවන් (නඩත්තු) සඳහා ප්‍රතිපාදන දිස්ත්‍රික්ක වෙත ලබා දීම.

11.7 සුළු වාරිමාර්ග පරීක්ෂණ ලේඛන හා කන්න රැස්වීම් ආකෘති පත්‍ර මුද්‍රණය.

